
# සැමට ජයක්



සමගි ජන සන්ධානය
ஐக்கிய மக்கள் கூட்டணி
SAMAGI JANA SANDHANAYA

සැමට
ජයක්


"මව්බිම සමෘද්ධිමත්
දේශයක් කරා මෙහෙයවමින්
සියලු පුරවැසියන්ගේ
ජන ජීවිතය සුරක්ෂිත කරවීම
මගේ ඒකායන අභිප්‍රායයි."
එක්වෙමු, කැපවෙමු, ජයගමු
- සජිත් ප්‍රේමදාස
සජිත් ප්‍රේමදාස
சஜித் பிரேமதாச
Sajith Premadasa
X

**ගෞරවණීය ස්වාමින් වහන්ස, පූජ්‍ය ප්‍රසාදී උතුමනි,**
**මා හිතවත් ශ්‍රී ලංකාවාසී පුරවැසියනි,**

අපේ රටේ දේශපාලන ගමන් මගේ තීරණාත්මක සංධිස්ථානයක් මතුවී තිබෙන මේ අවස්ථාවේදී අපේ රට දැනට මුහුණපා සිටින දුර්භාග්‍ය තත්වයෙන් මුදාගෙන රට අරමුණක් සහිතව යහපත් ආකාරයට වෙනස් කිරීම උදෙසා සමගි ජන බලවේගයේ සහ සමගි ජන සන්ධානයේ ජනාධිපති ධූර අපේක්ෂක සජිත් ප්‍රේමදාස වන මම මෙම ප්‍රතිපත්ති ප්‍රකාශය ඔබ වෙත ගෞරවයෙන් ඉදිරිපත් කරමි.

සමගි ජන සන්ධානය යනු නව දේශපාලන බලවේගයක් වන අතර සමාජ යුක්තිය පදනම් කරගනිමින් සමාජ වෙළඳපොල ආර්ථිකයක් ඔස්සේ නව ශ්‍රී ලංකාවක් නිර්මාණය කිරීමේ ඉදිරි දර්ශනයක් අප සතුව තිබේ. සැබෑ ප්‍රජාතන්ත්‍රවාදයක් යනු සෑම පුරවැසියකුගේම හඬ නිසි ලෙස ඇසෙන පරිදි යුක්තිය රජයන පාලන ක්‍රමයකි, රාජ්‍යයකි. ඒ අනුව අපගේ ආර්ථික සැලැස්ම හුදෙක් ආර්ථික වර්ධනය පිලිබඳ සංඛ්‍යා දත්ත කෙරෙහි පමණක් විශ්වාසය තබන්නක් නොවේ. එය සමාජයේ සෑම අංශයකටම ප්‍රයෝගිකව සහ භෞතිකව ලඟා කරගත හැකි සෞභාග්‍යයක් අත්පත් කරදීම ඉලක්ක කරගත් වැඩසටහනකි. අපි, ශ්‍රී ලාංකික සමාජයේ කිසිවෙකු අත් නොහැරෙන පරිදි සමානාත්මතාව පිලිබඳ ගැඹුරු කැපවීමකින් යුක්තව නිදහස් වෙළෙඳපොල ආර්ථිකයක ශක්තිය උකහා ගනිමින් නම්‍යශීලි සහ සර්වග්‍රාහී ආර්ථිකයක් නිර්මාණය කරන්නෙමු.

අපගේ ඉදිරි දර්ශනයේ තවත් විශේෂ අංග ලක්ෂණයක් වන්නේ දූෂණයට එරෙහිව සටන් වැදීමයි. අපගේ පුරවැසි ජනතාව මංකොල්ලකෑමට ලක් කරමින් රාජ්‍ය තන්ත්‍රය පිලිබඳ තිබූ විශ්වාසය පලුදු කරමින් අවසාන වශයෙන් මුළු රටම බංකොලොත් කිරීමට හේතු වී ඇත්තේ දීර්ඝ කාලයක් තිස්සේ රට තුළ පිළිකාවක් සේ උඩුදුවා ඇති දූෂණයයි. අනාගතයේදී බිහිවන සමගි ජන සන්ධාන රජයක් විසින් අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙමින් රාජ්‍යයේ සෑම අංශයකම විනිවිදභාවය සහ වගකීම තහවුරු කරමින් දූෂණය මුලිනුපුටා දැමීමට කටයුතු කෙරෙනු ඇත.

සෞභාග්‍යය කරා අප යන ගමනේදී අධ්‍යාපනය, සෞඛ්‍යය හා නිවාස නංවාලීම සඳහා අපි විශේෂ අවධානයක් ලබා දෙන්නෙමු. දැනට බොහෝ ගැටළු වලට මුහුණපා ඇති සෞඛ්‍යය අංශය එයින් මුදා ගෙන සෞඛ්‍යය අංශයට අයත් වෘත්තික හා තාක්ෂණ සම්පත් ආරක්ෂා කරමින් ශක්තිමත් ජාතියක් නිර්මාණය කිරිමට සෞඛ්‍යය අංශයේ සාර්ථකත්වය ඉහලින්ම ලබා ගැනීමට කටයුතු යොදන්නෙමු.

ශාස්ත්‍ර දැනුම සහ තාක්ෂණික දැනුම ශ්‍රී ලංකාවේ දියුණුවට දායක වන අයුරින් ද තරඟකාරී ලෝකයට ගැලපෙන මානව සම්පත් වර්ධනය කිරීමේ අරමුණ සහිතවද අධ්‍යාපන අංශයෙහි ලා විශාල ඉදිරිගාමී ප්‍රතිසංස්කරණයක් හඳුන්වා දෙන්නෙමු.

ඓතිහාසික වශයෙන් ගත් කළ වුව ද තනි තනි පුද්ගලයන් විසින් දියුණු කළ රටවල් නැත. දියුණු වූ සෑම රටක්ම එසේ වී ඇත්තේ සාමූහික උත්සාහයන් තුළිනි. සෑම අංශයකම කුසලතාපූර්ණ, පළපුරුදු සහ ප්‍රායෝගික ගුණය විහිදුවන හා විවිධ ක්ෂේත්‍ර වලට නායකත්වය දියහැකි දේශපාලන නායක කණ්ඩායමක් සමගි ජන සන්ධානය වටා අපි ඒකරාශී කරගෙන ඇත්තේ එබැවිනි.ඒ ඒ ක්ෂේත්‍ර වලට අදාලව මතු වී තිබෙන අභියෝග මෙන් ම අවස්ථාවන් පිළිබඳව මේ පිරිස සතුව ඇති ගැඹුරු අවබෝධය මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්ක සාධනය කර ගැනීම සඳහා මහත් පිටුවහලක් වනු ඇත.

සමගි ජන සන්ධානය යනු තවත් එක් දේශපාලන පක්ෂයක් නොවේ. එය ශ්‍රී ලංකාවේ සැබෑ ශක්තිය හඳුනාගෙන යුගය විසින් ඉල්ලා සිටින වෙනස්කම් සාධනය කිරීමේ ශක්‍යතාවෙන් යුතු මේ යුගයේ සැබෑ ජනතා බලවේගයයි. මේ ජනාධිපතිවරණයේ මා ඔබෙන් ජන වරමක් ඉල්ලා සිටින්නේ හුදෙක් මා සඳහා නොව, වඩා ශක්තිමත්, සාධාරණ, සහ සෞභාග්‍යය සම්පන්න රටක් ගොඩනැගීම සඳහා ඔබ අප සැමගේම ශක්තිය ඒකරාශී කර ගැනීමේ සද්කාර්යයක් වශයෙනි. අපි සැවොම එක්සත්ව, එක්සිත්ව එක්ව අපගේ ආදරණීය මවුබිම වන ශ්‍රී ලංකාව සෞභාග්‍යය මාවතේ ඉදිරියටම පියමන් කරවීම සඳහා කැප වී කටයුතු කරමු.

ස්තුතියි.

මෙයට විශ්වාසී,

**සජිත් ප්‍රේමදාස**
නායක - සමගි ජන සන්ධානය

2024 අගෝස්තු 29 වැනිදා

සැමට
ජයක්

**සමගි ජන බලවේගය**

**592, කෝට්ටේ පාර, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ 10100**

**දුරකතන - 0112870112**

විද්‍යුත් තැපැල - info@sajith.lk

වෙබ් අඩවිය - www.sajith.lk

# පෙළගැස්ම

**ශක්තිමත් ආර්ථිකයක් ගොඩනැංවීම** ........ 08

- විනිවිදභාවය සහ වගවීම
- ණය අර්බුදය කළමනාකරණය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල
- මූල්‍ය සහ විනිමය අනුපාත ප්‍රතිපත්තිය
- ආදායම් වර්ධනයක් අත්කර ගැනීම
- වියදම් පාලනය
- ආර්ථික අභිවෘද්ධිය උත්තේජනය කිරීම
- රාජ්‍ය අංශ කළමනාකරණය සහ ඩිජිටල්කරණය
- බලශක්ති සහ උපයෝගිතා ප්‍රතිසංස්කරණ
- නිෂ්පාදන සාධක වෙළෙඳපළ ප්‍රතිසංස්කරණය
- කෘෂිකර්මය හා පශු සම්පත් සංවර්ධනය
- ඉඩම්, වාරිමාර්ග සහ ජල කළමණාකරණය
- ප්‍රවාහනය - මහාමාර්ග, නාවික සහ ගුවන
- ධීවර හා ජලජ සම්පත්
- සංචාරක කර්මාන්තය
- විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ
- කර්මාන්ත අංශය
- ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (MSME) අංශය
- මැණික් හා ස්වර්ණාභරණ අංශය
- ඉදිකිරීම් අංශය
- විදුලි බලය සහ බලශක්තිය

**සෑම පුරවැසියෙකුම බලගැන්වීම** ........ 18

- අධ්‍යාපනය, වෘත්තීය පුහුණුව සහ තාරුණ්‍යය
- කාන්තාවන් සහ ළමුන් සවිබලගැන්වීම
- සෞඛ්‍යය, පෝෂණය, දේශීය වෙදකම හා සමාජ සුභසාධනය
- සවිබලගැන්වීම සහ සමෘද්ධිය ගොඩනැගීම
- ආබාධ සහිත තැනැත්තන්
- ආදිවාසී ජන ප්‍රජාව
- ක්‍රීඩා

**රාජ්‍ය සේවය නංවාලීම** ........ 24

- විසි එක්වන සියවස සඳහා ඩිජිටල් ශ්‍රී ලංකාවක්
- සැලසුම් සහ සැලසුම් ක්‍රියාත්මක කිරීම
- රාජ්‍ය සේවය
- පාස්පෝට් පෝළිම අවසන්

**ජීවන තත්ත්වය ආරක්ෂා කිරීම** ........ 27

- ආගමික හා සංස්කෘතික කටයුතු
- මාධ්‍ය
- නිවාස හා පොදු පහසුකම්
- විදෙස්ගත ශ්‍රමිකයන් සහ සේවා නියුක්තිය
- වැවිලි සහ "මලෙයි ජන ප්‍රජාව"
- විශ්‍රාමික ප්‍රතිලාභ සුරැකීම
- රණවිරු සුභසාධනය
- ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාලයක් ගොඩනැගීම

**රාජ්‍ය ආරක්ෂාව** ........ 32

- ප්‍රජාතන්ත්‍රවාදය හා සංහිඳියාව ශක්තිමත් කිරීම
- විදේශ සබඳතා සහ වෙළෙඳ සන්ධාන
- ජාතික ආරක්ෂාව
- නීතිය හා සාමය
- දූෂණ විරෝධී නීති
- මත් උවදුර මැඩලීම
- තිරසර පරිසරය

# ශක්තිමත් ආර්ථිකයක් ගොඩනැංවීම

සමාජ වෙළෙඳපළ ආර්ථික ආකෘතියක් හරහා වර්ධනයේ ප්‍රතිලාභ සැමට ලැබෙන බවට තහවුරු කරමින් සාධාරණ වර්ධනයක් ඇති කිරීම කෙරෙහි අවධානය යොමු කරන අතර, ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ සහ සමෘද්ධිමත් සංවර්ධනයක් කරා යන මාවතේදී විනිවිදභාවයත්, තිරසාරභාවයත් සහ සියලු පුරවැසියන්ට ශක්තියක් වනු ඇති බවටත් සහතික කරමු.



අධික ණය, දුර්වල ප්‍රතිපත්ති තීරණ සහ දුර්වල පාලනය හේතුවෙන් ඇති වූ උග්‍ර ආර්ථික අර්බුදයට ශ්‍රී ලංකාව තවමත් මුහුණදෙමින් සිටී. මෑතකදී ගත් පියවර මගින් උද්ධමන වේගය අඩු කිරීමට සහ විදේශ සංචිත ඉහළ නැංවීමට තරමක් උපකාර වූ නමුත්, ආර්ථිකය සම්පූර්ණයෙන් ප්‍රකෘතිමත් වීම සහ දියුණු ආර්ථිකයක් බවට පත්වීම සඳහා වන මාර්ගය තවදුරටත් ඉතා අභියෝගාත්මක වේ. එසේම සාමාන්‍ය පුරවැසියන් තවමත් ඉහළ මිල ගණන්, ඉහළ බදු සහ බලාපොරොත්තු සුන්වීම හේතුවෙන් පීඩාවට පත් වී ඇත.

සමාජ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන මූලධර්ම මගින් මෙහෙයවනු ලබන සමාජ වෙළෙඳපොළ ආර්ථික ආකෘතියක් අපි අනුගමනය කරන්නෙමු. මෙමගින් සාධාරණ හා සියල්ලන් ඇතුළත් කරගත් ආර්ථික වර්ධනයක් ඇති කිරීම සඳහා, වෙළෙඳපොළ ශක්තීන් උපයෝගී කරගනිමින් සමාජ යුක්තිය හා සැමට ආරක්ෂාව සහතික කරන්නෙමු. අපගේ ආර්ථික යෝජනා සැලැස්ම 3.0 (Blueprint 3.0) මගින් මෙම අභියෝග ජය ගැනීමට, ශක්තිමත් වර්ධනයක් තුළින් ආර්ථිකය යළි ගොඩ නැගීමට සහ සියලු දෙනාට සමෘද්ධිමත් අනාගතයක් සුරක්ෂිත කිරීමට උපායමාර්ගික සැලැස්මක් සපයයි. දූෂණය තුරන් කිරීම මෙම සැලැස්මේ ප්‍රධාන කොටසක් වුවද, එය එකම විසඳුම නොවන බව අපි දනිමු. ආර්ථික අභිවෘද්ධිය සහ සංවර්ධනය සඳහා හරිත ආර්ථිකයක් හා පාරිසරික තිරසරභාවයක් ප්‍රවර්ධනය කිරීම ද අපගේ මූලික සංකල්ප අතර ප්‍රමුඛ වේ.

තිරසර වර්ධනයක් ළඟා කරගැනීමට අපට දෙයාකාර ප්‍රවේශයක් අවශ්‍ය වේ. පළමුව, අපි ආර්ථිකය ප්‍රතිසංස්කරණය කර, එය වඩාත් තරගකාරී සහ ගෝලීයව සම්බන්ධ ආර්ථිකයක් බවට පත් කළ යුතුය. මෙමගින් ජනතාව අතර ධනය නිර්මාණය කරනු ඇත. දෙවනුව, අවදානමට ලක්විය හැකි පුද්ගලයන් ආරක්ෂා කිරීම සඳහා ඉලක්කගත සහනාධාර සහිත ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාලයක් තුළින් ආර්ථික යුක්තිය සහ සමානාත්මතාව සහතික කරනු ඇත. තවද, ආර්ථික ප්‍රගතිය අපගේ පුරවැසියන්ගේ යහපැවැත්ම හා සමස්ත සතුට සමඟ අත්වැල් බැඳගෙන සමාජයක් ගොඩනැගීම තුළින් දළ ජාතික සතුට (Gross National Happiness) ඉහළ නැංවීමට අපි අපේක්ෂා කරමු.

## විනිවිදභාවය සහ වගවීම

ශක්තිමත් දූෂණ විරෝධී නීති හඳුන්වා දීම සහ වත්මන් නීති රාමුව ක්‍රියාත්මක කිරීම මගින් යුක්තිය ඉටු කිරීම වේගවත් කරනු ඇත. සොරකම් කරන ලද වත්කම් යළි ලබා ගැනීම සහ රටේ පරිපාලන පද්ධතියේ පැතිර පවතින දූෂණ මැඩපැවැත්වීම සඳහා ශක්තිමත් වැඩසටහනක් ප්‍රධාන වශයෙන් අවශ්‍යව ඇත. දූෂිත පුද්ගලයන් යුක්තිය ඉදිරියට ගෙන ඒම සඳහා දේශපාලන මැදිහත්වීම්වලින් තොර ස්වාධීන මහජන අභිචෝදක කාර්යාලයක් පිහිටුවීම නීති සංශෝධනයක් මගින් සිදු කෙරෙනු ඇත. රාජ්‍ය ප්‍රසම්පාදනය විනිවිදභාවයෙන් යුතුව, දූෂණයෙන් තොරව සහ කාර්යක්ෂමව සිදු කරන බවට සහතික වීම සඳහා මහජන ප්‍රසම්පාදන පනතක් සම්මත කරන්නෙමු. සියලුම රජයේ ප්‍රසම්පාදන ඩිජිටල් වේදිකාවකට මාරු කෙරෙනු ඇත.

පාරිභෝගිකයාට හොඳම ගුණාත්මකභාවය සහ මිල ලබා දීම සඳහා, තරගකාරී නීතියක් වහාම හඳුන්වා දීම තුළින් ඒකාධිකාරී සහ කිහිපදෙනෙකුගේ ආධිපත්‍ය සහිත හැසිරීම් නිවැරදි කෙරෙනු ඇත.

රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ විනිවිදභාවය ඇති කරන්නෙමු. රජයේ වියදම් සැලසුම සහ ණය කළමනාකරණ උපායමාර්ග මෙන්ම බදු පරිපාලනය පිළිබඳව ද සම්පූර්ණ තොරතුරු මහජනතාවට ලබාදෙනු ඇත. පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ උපරිම සහාය ලබා ගනිමින්, මින් ඉදිරියට රජයේ සියලුම බදු සහ වියදම් යෝජනා පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් සැපයෙනු ඇත.

## ණය අර්බුදය කළමනාකරණය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇතිකරගත් ගිවිසුම ප්‍රකාර රාජ්‍ය මූල්‍ය විනය ශක්තිමත් කරමින් ආදායම, ප්‍රාථමික ගිණුමේ ශේෂය සහ ණය ආශ්‍රිත ඉලක්ක සපුරාලීම සඳහා දුෂ්කර නමුත් අවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු නොකඩවා සිදු කරන්නෙමු. කෙසේ වුවද, දුගී බවේ රේඛාවෙන් පහළ මට්ටමේ පුද්ගලයන් වෙත අවශ්‍ය සහන ලබාදෙන බවට සහතික කිරීමේ වත්මන් වැඩසටහනට සංශෝධන ඉදිරිපත් කරමින් ශ්‍රී ලාංකිකයන් සඳහා අවශ්‍ය ජීවන තත්ත්වය වැඩිදියුණු කරන්නෙමු.

විදේශීය ණය හිමියන්ට අපේක්ෂිත දළ දේශීය නිෂ්පාදන වර්ධනයට වඩා වැඩි ප්‍රතිලාභ ලබා ගැනීමට 'ආපසු ලබා ගැනීමේ' වගන්ති සහිත විසඳුමකට එකඟ වන අවස්ථාවක, දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ බර දරා සිටින සේවක අර්ථසාධක අරමුදලට ද 'සමාන සැළකීම' ලබා දෙන බවට අපි අවධාරණය කරන්නෙමු.

## මූල්‍ය සහ විනිමය අනුපාත ප්‍රතිපත්තිය

නව පනත මගින් ප්‍රතිපාදන සලසා ඇති පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) ස්වාධිපත්‍යයට ගරු කරන නමුත් සිය උද්ධමන ඉලක්කය සපුරාලීම සඳහා වූ වගවීමට යටත් කරන්නෙමු. තවද, ජාත්‍යන්තර වශයෙන් තරගකාරී විදේශ විනිමය අනුපාතිකයක් සහ අඩු හා ස්ථාවර පොලී අනුපාත සහතික කිරීමට සහාය ලබා දෙන්නෙමු.

## ආදායම් වර්ධනයක් අත්කර ගැනීම

රාජ්‍ය ආදායම ඉහළ නැංවීම සඳහා පවත්නා එකම විසඳුම බදු ඉහළ නැංවීම පමණක් නොවේ. ආදායම වර්ධනය කිරීම, වියදම් සහ දූෂණ අවම කිරීම සඳහා ඩිජිටල් තාක්ෂණය හඳුන්වා දීම අපගේ මූලික කටයුත්තක් වේ. එසේම වෘත්තිකයන්ට විදේශ රැකියා වෙත යොමු වීමට බල කරන අසාධාරණ බදු ව්‍යුහයන් සංශෝධනය කරන්නෙමු.

සමස්ත ආදායම් ඉලක්කවලට බාධාවක් නොවන පරිදි මධ්‍යම පාන්තිකයන්ගේ අධික ජීවන බර සැහැල්ලු කිරීම ඉලක්ක කරගත් අප යෝජනා කරන සංශෝධිත බදු ව්‍යුහයේ ඇතැම් විශේෂ අවස්ථා පහත පරිදි වේ.

- **පුද්ගල ආදායම් බද්ද:** මාසිකව රු. 100,000 බදු නිදහස් කාණ්ඩයෙන් අනතුරුව පුද්ගල ආදායම් බද්ද 1%ක අගයකින් ආරම්භ වී මාසිකව මිලියන භාගයක පමණ ආදායමක් දක්වා 24% කට සීමා වනු ඇත. ඉනික්බිති, වඩා ඉහළ ආදායම් ලබන්නන් සඳහා වත්මන් අනුපාතයන් අදාළ කෙරෙනු ඇත.

- **ආයතනික ආදායම් බද්ද:** අපනයන මත ලාභ සඳහා දැනට පවතින 30% අනුපාතය 6% දක්වා අඩු කිරීමට සහ බහුජාතික සමාගම් සඳහා 15% පදනම් ඛාදන හා ලාභ විතැන්කරණ (Base Erosion and Profit Shiftinට) අවම විකල්ප බද්දක් හඳුන්වා දීමට අදහස් කරමු.

- **එකතු කළ අගය මත බද්ද:** බදු දැල පුළුල් කරනු පිණිස පොදු ඩිජිටල් යටිතල පහසුකම් හරහා බදු එකතු කිරීම වැඩිදියුණු වූ පසු එකතු කළ අගය මත බද්ද 15% දක්වා අඩු කිරීමට අපේක්ෂා කරන්නෙමු. අත්‍යවශ්‍ය ආහාරවලට අමතරව පාරිභෝගික ද්‍රව්‍ය ලෙස හඳුනාගත් ඇතැම් අයිතම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරනු ඇත.

- සිගරට් සහ මධ්‍යසාර සඳහා නිෂ්පාදන බද්ද සහ කැසිනෝ සඳහා වන බද්ද, බදු අවම කිරීම සඳහා වන අරමුදල් සැපයීමට භාවිතා කරනු ඇත.

- ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීම් සඳහා සහතික කළ 15% ක් දක්වා වූ පොලී අනුපාතයක් ලබා දෙනු ඇත.

## වියදම් පාලනය

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන මගින් ආදායම් වැඩිකර ගැනීම කෙරෙහි අවධානය යොමු කර ඇතත් එමගින් රජයේ වියදම් පාලනයට ප්‍රමාණවත් ලෙස අවධානය යොමු කර නොමැත. එබැවින් නාස්තිකාර රාජ්‍ය වියදම් සහ දූෂණය පාලනය කිරීම අපගේ ආර්ථික දැක්මේ අරමුණ වේ. රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිසංස්කරණය කිරීම ද මෙයට ඇතුළත් ය. එසේ ඉතිරි කරන අරමුදල් විපතට පත් ජනතාව සඳහා සමාජ ආරක්ෂණ ජාලයක් ක්‍රියාත්මක කිරීමට සහ අධ්‍යාපන හා සෞඛ්‍ය අංශ ශක්තිමත් කිරීම වෙනුවෙන් යොදා ගැනේ.

රාජ්‍ය වියදම් පාලනය කිරීම සහ මහජන විශ්වාසය ඉහළ නැංවීම සඳහා රජයේ වියදම් පාලනය කරමින් රජයේ වියදම්වල විනිවිදභාවය සහ වගවීම ශක්තිමත් කිරීමට දත්ත පදනම්ගත සැලසුම්කරණ ක්‍රමවේද භාවිතා කරන්නෙමු.

## ආර්ථික අභිවෘද්ධිය උත්තේජනය කිරීම

ආර්ථික වර්ධනයේ ප්‍රධාන ධාවකයා ලෙස මහා පරිමාණ සහ සුළු පරිමාණ පුද්ගලික ව්‍යවසායන් සමඟින් එක්ව ගෝලීය වශයෙන් සම්බන්ධිත සමාජ වෙළෙඳපළ ආර්ථිකයක් බවට ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීමට අප රජය කැපවී සිටිනු ඇත. මෙම පරිවර්තනය සඳහා ප්‍රධාන ක්‍රියාමාර්ග දෙකක් අවශ්‍ය වේ. ඒ වෙළඳ ලිබරල්කරණය සහ විදේශ සෘජු ආයෝජන හරහා ගෝලීය ආර්ථික ඒකාග්‍රතාව වැඩි දියුණු කිරීම සහ නිෂ්පාදන සහ ශ්‍රම වෙළඳපොල ඇතුළුව දේශීය වෙළෙඳපළ නිදහස් කිරීම වශයෙනි. ඵලදායී වෙළෙඳපළ සංඥා සහතික කිරීම මගින් ජාතික සංවර්ධනය සඳහා පුද්ගලික අංශයේ සම්පූර්ණ සහභාගීත්වය සඳහා ඉඩ සලසනු ඇත.

- **කෘෂිකාර්මික ප්‍රතිසංස්කරණ**

කෘෂිකාර්මික අංශයන්හි විවිධ ක්ෂේත්‍රවල පැන නැගී ඇති අභියෝග විසඳීමට කැපවන්නෙමු. පැරණි නීති නවීකරණය කළ යුතුව පවතී. කෘෂිකර්ම වෙළෙඳපළ පහසුකම්කරණය ද, වාරි සහ වැව් ප්‍රතිසංස්කරණය ද, මූල්‍ය හා රක්ෂණ පහසුකම් ද ලබා දිය යුතුව ඇත.

පුද්ගලිකව එක් එක් ගොවි මහතා සම්බන්ධයෙන් ගත් කල, නිෂ්පාදනය කරනු ලබන්නේ කවර භෝගයක්ද, කොපමණද සහ කවදාද යන්න පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ සිට මූල්‍ය යෙදවුම් සහ වගා චක්‍ර කළමනාකරණය දක්වා විහිදෙන සමස්ත අගය දාමය වැඩිදියුණු කළ යුතුව පවතී. ඉනික්බිති ගබඩාකරණය, සැපයුම් සේවාවන්හි සිට අලෙවිය දක්වා සිදු කෙරෙන පසු අස්වනු කළමණාකරණයට අදාළ ප්‍රශ්න විසඳිය යුතුව පවතී.

ග්‍රාමීය දිළිදු බව අවම කිරීම, ඵලදායීතාව ඉහළ නැංවීම සහ ග්‍රාමීය අංශයේ වර්ධනය ඉහළ නැංවීම සඳහා වේගවත්, සුහුරු තාක්ෂණය මත පදනම් වූ කෘෂිකාර්මික නවීකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නෙමු. මෙයට - වී, එළවළු සහ වැවිලි භෝග වගාවේ සිට විකිණීම දක්වා, ආරක්ෂිත කෘෂිකර්මය, ජල එසැවුම් වාරි කටයුතු (Lift Irrigation), ජල බිඳු ඉසුම් වාරි කටයුතු (Drip Irrigation) සහ ඇතැම් විට කෘත්‍රිම බුද්ධි-සහයෝගී හයිඩ්‍රොපොනික් ගොවිතැන වැනි නවෝත්පාදන ඇතුළත් වේ. ඩිජිටල් පොදු යටිතල පහසුකම් (DPI) දියත් කිරීමත් සමඟ මෙම උත්සාහය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට හැකි තත්ත්වයක් නිර්මාණය වනු ඇත.

සහල් මිල පහත හෙළීම සහ එම මිලෙහි පවත්වා ගැනීම සඳහා "ශක්ති" සහල් මෝල් හිමි දීප ව්‍යාප්ත සමුපකාර වැඩසටහන නැවත හඳුන්වා දෙන්නෙමු. 40%ක් පමණ වන පසු අස්වනු හානිය අවම කිරීම සඳහා දේශගුණික පාලනය යටතේ ක්‍රියාත්මක කෘෂිකාර්මික නිෂ්පාදන ගබඩා ජාලයක් වන "ප්‍රභාෂ්වර" වැඩසටහන කඩිනමින් රට පුරා ස්ථාපිත කරන්නෙමු. මෙය ද ආහාර මිල අඩු කිරීම සඳහා දායක වනු ඇත.

- **කර්මාන්ත සංවර්ධනය: ගෝලීය අගය දාමයට සම්බන්ධ වීම**

මේ දක්වා ප්‍රයෝජනයට ගෙන නොමැති පුහුණු කළ හැකි ශ්‍රම බලකාය සහ අපගේ උපායමාර්ගික පිහිටීම උපයෝගී කර ගනිමින් කොටස් වශයෙන් වූ සංරචක නිෂ්පාදනය කිරීමෙන් ආරම්භ වන ගෝලීය නිෂ්පාදන අගය දාම (Global Manufacturing Value Chains) වෙත ශ්‍රී ලංකාව සම්බන්ධ කෙරෙනු ඇත. මෙහිදී, මිනිරන් ඇතුළු තීරණාත්මක වැදගත්කමකින් යුත් ද්‍රව්‍යවල පරිවර්තනයන් භාවිතා කරමින් ගෝලීය ඉලෙක්ට්‍රොනික සහ විදුලි භාණ්ඩ නිෂ්පාදනය මෙන්ම විදුලි වාහන

උපාංග නිෂ්පාදනයන් සමග ද ඒකාබද්ධ වීමට සැලසුම් කරන්නෙමු. ඇඟලුම් ක්ෂේත්‍රයේ සාර්ථකත්වය තවදුරටත් ඉදිරියට ගෙන යාමට ද අප රජය කැපවෙනු ඇත.

- **අගය නිර්මාණයේ ප්‍රධාන සාධකයක් වන සේවාවන්**

සේවා අංශය සංවර්ධන සැලැස්මේ ප්‍රධාන සංරචකයකි. විද්‍යුත් වාණිජකරණය සහ තොරතුරු තාක්ෂණ සේවාවන් හා ශ්‍රී ලංකාව සැපයුම් සේවා මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කිරීමෙහි ලා අපගේ අවධානය යොමුවනු ඇත.

- **ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (MSMEs) සහ නව ව්‍යාපාර පරිසර පද්ධතිය**

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ආරම්භක ව්‍යාපාර ආර්ථික වර්ධනයට දායක වන විශාල ආයතන මෙන්ම සමස්ත අගය එකතු කිරීම්වලින් අඩකට සහ සමස්ත රැකියා වෙළෙඳපළේ අඩකට පමණ දායක වේ. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දිගු කලක් නොසළකා හැර පැවති අතර විශේෂයෙන් වසංගතය සහ ඉන් පසුව එළැඹි ආර්ථික බිඳවැටීම හේතුවෙන් වර්තමානයේ අර්බුදයට ලක්ව ඇත. ශ්‍රී ලංකාවේ අපේක්ෂිත ඉහළ වර්ධනය සඳහා ප්‍රධාන දායකයෙකු බවට පත්වනු පිණිස ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සවිබල ගැන්වීමට ඩිජිටල් ප්‍රවේශනය, ප්‍රාග්ධනය සහ පුහුණු වැඩසටහන් ලබාදීම සිදු කරනු ඇත.

- **වරාය නගරය**

මූල්‍ය තාක්ෂණය, ජෛව තාක්ෂණය සහ නැනෝ තාක්ෂණය ද ඇතුළත් තාක්ෂණික සේවා සඳහා ආසියාවේ කලාපීය මධ්‍යස්ථානය බවට වරාය නගරය පත් කිරීමට අවශ්‍ය නීති සංශෝධන ගෙන එන්නෙමු.

## රාජ්‍ය අංශ කළමනාකරණය සහ ඩිජිටල්කරණය

සෞඛ්‍ය, අධ්‍යාපනය සහ සමාජ සේවා කාර්යක්ෂම සහ සාධාරණ ලෙස පොදුවේ ආර්ථික සංවර්ධනය සහ සිවිල් ආරක්ෂාව සඳහා ඉතා වැදගත් වේ. මෙම සේවාවන් සැපයීමේ වගකීම ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය සතුවේ. එහෙත් එය විවිධ සමාන්තර සේවාවන් අතර ඇති ගැටලු, නිසි ලෙස කළමනාකරණය නොවූ මානව සම්පත සහ අඩු වැටුප් හේතුකොට ගෙන පීඩාවට පත්ව ඇත. රාජ්‍ය ප්‍රසම්පාදනයේ සිට සේවා සැපයීම දක්වා සියලු අංශයන්හි ක්‍රියාත්මක දූෂණය සහ වගවීමේ ගැටළු විසඳීමට දශක ගණනාවක ප්‍රතිසංස්කරණ අපොහොසත් වී ඇත. ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශක හඳුන්වා දීම සහ ඩිජිටල්කරණය හරහා රාජ්‍ය සේවය ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කරන්නෙමු. දූෂණය අවම කරන අතරම කළමනාකරණය, විනිවිදභාවය සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම මෙමඟින් සිදුවනු ඇත.

රජය සතු ව්‍යාපාර පිළිබඳ මව් සමාගමක් ස්ථාපනය කිරීම රජය සතු ව්‍යාපාර ප්‍රතිසංස්කරණයෙහි ප්‍රධාන කොටසක් වේ. මෙම රජය සතු ව්‍යාපාර පිළිබඳ මව් සමාගම විසින් සිංගප්පූරුවේ තමසෙක් මාදිලියට සමාන ව්‍යුහයක් යටතේ රජය සතු ව්‍යාපාර හිමිකාරිත්වය කළමනාකරණය සඳහා වූ මධ්‍යගත සහ ක්‍රමෝපායික රාමුවක් සම්පාදනය කරනු ඇත. ජාතික ආරක්ෂක අභිලාශයන් ජාත්‍යන්තර තරගකාරීත්වය සහ කාර්යක්ෂමතාව ද සමඟින් තුලනය කරමින්, විවිධ පාර්ශ්වකරුවන්ගේ බහුවිධ අරමුණු මත පදනම්ව එක් එක් රජය සතු ව්‍යාපාරය ආශ්‍රිතව රජය විසින් පවත්වා ගනු ලබන කොටස් හිමිකාරීත්ව ප්‍රතිශතය තීරණය කෙරෙනු ඇත.

- **රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව වර්ධනය කරනු පිණිස ඩිජිටල් සෞඛ්‍ය පොදු යටිතල පහසුකමක් ගොඩනැගීම**

ඖෂධ ප්‍රසම්පාදනයේ සිට සියලු සෞඛ්‍ය සේවාවන් දක්වා අධිතාක්ෂණික විසඳුම් සමඟින් සෞඛ්‍ය අංශය පරිවර්තනයකට ලක් කෙරෙනු ඇත. ගුණාත්මකභාවය සහ කාර්යක්ෂමතාව වැඩි වර්ධනය කරනු පිණිස ලොව දියුණුතම සහ වේගවත්ම ගිලන් රථ සේවාවක් වශයෙන් ඇගයීමට ලක් වූ 1990 සුව සැරිය ගිලන් රථ සේවය සඳහා ඩිජිටල් තාක්ෂණය භාවිත කිරීමෙන් උගත් පාඩම් අනෙකුත් සෞඛ්‍ය සේවාවන් වෙත ද ආදර්ශ කොට ගනු ඇත.

## බලශක්ති සහ උපයෝගිතා ප්‍රතිසංස්කරණ

විදුලිබල සහ බලශක්ති ක්ෂේත්‍රයන්හි අපගේ ප්‍රවේශය තුළ පුද්ගලික අභිමතය අවම කරන විනිවිද පෙනෙන, ස්වයංක්‍රීය පද්ධති ක්‍රියාවට නැංවීම කෙරෙහි අවධානය යොමු කරනු ඇති අතර, පුද්ගල අභිමතාර්ථ ප්‍රකාර හැසිරවීම සඳහා අවකාශ සලසන හිඩැස් වසා දමමින් නොකැඳවූ යෝජනා (Unsolicited Proposal) කෙරෙහි යොමු වීම සඳහා 'ඩීල්කරුවන්' වෙත පවත්නා දිරිගැන්වීම් ඉවත් කෙරෙනු ඇත.

ජනනය හා බෙදාහැරීම ආශ්‍රිත තරඟකාරීත්වයක් නිර්මාණය කිරීම අවශ්‍ය වන අතර, ඒකාධිකාරී බලය සහ අකාර්යක්ෂමතාව හේතුකොට ගෙන ඉස්මතුවන අධික බලශක්ති පිරිවැයෙහි බර පාරිභෝගිකයා සහ කර්මාන්තය විසින් දැරිය යුතු නොවේ. පිරිවැය පිළිබිඹු කරන්නාවූ විදුලි ගාස්තු ක්‍රමයට සහාය දක්වන නමුදු මෙම පිරිවැයෙන් විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් තුළ සිදුවන දූෂණයන් සහ අකාර්යක්ෂමතාවයේ බර ඉවත් විය යුතුය.

නව විදුලිබල පනතින් යෝජිත ව්‍යුහය නැවත තක්සේරු කොට ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව සහ පිරිවැය ඵලදායකත්වය නංවාලනු වස් සංශෝධන නිර්දේශ කරන්නෙමු. අපගේ ප්‍රමුඛතාවන් තුළට සාධාරණ විදුලි වෙළෙඳපළක් ස්ථාපනය කිරීම, පාරිභෝගික යහපත ආරක්ෂා කිරීම, වගවීම වැඩි කිරීම හා කර්මාන්තය නිර්-දේශපාලනීකරණය ද ඇතුළත් වේ.

ශ්‍රී ලංකාව කලාපීය පුනර්ජනනීය බලශක්ති මර්මස්ථානයක් බවට පත් කිරීම ඉලක්ක කොටගෙන, 2030 වනවිට පුනර්ජනනීය බලශක්ති ජනනයෙන් 70% ඉලක්කය සපුරා ගැනීම පමණක් නොව එම සීමාව ඉක්මවා යාම ද අපගේ ඉදිරි දැක්ම වේ.

## නිෂ්පාදන සාධක වෙළෙඳපළ ප්‍රතිසංස්කරණය

ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පහසු කිරීමට සහ දේශීය හා විදේශීය ආයෝජන ප්‍රවර්ධනය කිරීමට ඉඩම්, ශ්‍රම සහ ප්‍රාග්ධන වෙළෙඳපළවල් මත පනවා ඇති සීමා ලිහිල් කිරීම මගින් නිෂ්පාදන සාධක වෙළෙඳපළ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන්නෙමු.

ඉඩම් ඵලදායීතාව වැඩිදියුණු කිරීම සහ ඉඩම් අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම අරමුණු කරගත් ජාතික ඉඩම් ප්‍රතිසංස්කරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අපේ රජය කැපවී සිටී. දැනට ක්‍රියාත්මක වන "බිම් සවිය" වැඩසටහන සම්පූර්ණ කරමින් ඩිජිටල් ඉඩම් ලේඛනයක් සෑදීම ප්‍රමුඛ කාර්යයක් වනු ඇත.

මානව ප්‍රාග්ධන සංවර්ධනයේ වැදගත්කම හඳුනා ගනිමින්, අධ්‍යාපන ප්‍රතිඵල වැඩිදියුණු කිරීම, රැකියාවලට අදාළ කුසලතා සංවර්ධනය කිරීම සහ නවෝත්පාදනය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ප්‍රතිපත්ති සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන්නෙමු. තරඟකාරී ශ්‍රම බලකායක් ගොඩනැගීම සඳහා අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහ ප්‍රවේශය වැඩිදියුණු කිරීම තීරණාත්මක වේ. ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායට අනාගත රැකියා සඳහා අවශ්‍ය කුසලතා ඇති බවට වගබලා ගැනීම උදෙසා වූ වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

ප්‍රාග්ධනය ගලා ඒම වර්ධනය කරමින් දේශීය ප්‍රාග්ධන වෙළෙඳපළ ශක්තිමත් කිරීමට කඩිනම් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන්නෙමු. ආර්ථික වර්ධනය උත්තේජනය කරමින් දැනට ක්‍රියාත්මක ආයෝජකයන් හට සහාය ලබාදෙනු පිණිස සෘජු විදේශ ආයෝජන (FDI) වැඩි කිරීමට ප්‍රධාන නීති ප්‍රතිසංස්කරණය කෙරෙනු ඇත.

## කෘෂිකර්මය හා පශු සම්පත් සංවර්ධනය

- පවතින ගොවි ණය කපා හැරීම මගින් ගොවීන්ගේ ණය බර සැහැල්ලු කිරීම සඳහා පියවර ගනු ලැබේ. මීට අමතරව, ගොවීන්ට තම ගොවිතැන් කටයුතු සඳහා සහාය වීමට අත්‍යාවශ්‍ය ණය පහසුකම් වෙත ප්‍රවේශය ඇති බව අපි සහතික කරන්නෙමු.
- අපි පොහොර කිලෝග්‍රෑම් 50ක මල්ලක් රුපියල් 5,000 කට ලබා දෙන්නෙමු. මෙය අපගේ ගොවීන්ට අඛණ්ඩව ලබාගත හැකි බවට සහතික කරන්නෙමු.
- ගොවීන් සුරාකෑමෙන් ආරක්ෂා කරමින් ඔවුන්ගේ ජීවනෝපාය සුරක්ෂිත කිරීම සඳහා වී නිෂ්පාදනය සඳහා ඉහළම සහතික මිලක් ලැබෙන බවට අපි සහතික කරන්නෙමු.
- කෘෂි වගාවන් සඳහා අවශ්‍ය අධික අස්වැන්න ලබා දෙන බීජ, රෝපණ ද්‍රව්‍ය, පළිබෝධනාශක, මෙවලම් සහ තාක්ෂණය යන සියල්ල සාධාරණ මිලකට අඛණ්ඩව සැපයීම අපි සහතික කරන්නෙමු. බීජ සුරක්ෂණය ද එහි ප්‍රධාන කොටසක් වනු ඇත.
- "ගොවි ඥාන සේවා" කෘෂි තොරතුරු වෙළෙඳපළ ක්‍රමවේදය ස්ථාපනය කොට කෘෂි නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ලබාගැනීමේ අවස්ථාව ගොවියාට ලබාදෙනු ලැබේ. මෙම වෙළෙඳපළ ක්‍රමවේදය ඔස්සේ කෘෂි නිෂ්පාදන අලෙවි කිරීම සඳහා දෙස්-විදෙස් ගැණුම්කරුවන් සම්බන්ධ කර ඔවුන් සමඟ ඉදිරි වෙළෙඳ ගිවිසුම් (Forward Sales Contract) ඇති කිරීමේ හැකියාව ප්‍රවර්ධනය කරනු ලැබේ.
- කෘෂිකාර්මික ප්‍රදේශවල ජංගම හා අන්තර්ජාල පහසුකම් වැඩිදියුණු කිරීම මගින් ඩිජිටල් පද්ධති භාවිතා කර ගොවීන්ට තාක්ෂණික උපදෙස් ලබාදීම හා මෙරට හා විදේශවල කෘෂි නිෂ්පාදන ගැණුම්කරුවන් හා සම්බන්ධතා ඇති කිරීම සිදු කරයි.
- ආහාර සුරක්ෂිතතාව සහතික කරනු පිණිස රජයේ කෘෂිකර්මය හා සම්බන්ධ සියලු ආයතනයන් නවීකරණය කරනු ඇත.
- අගය එක් කිරීම, භෝග විවිධාංගීකරණය, නවීන කෘෂි යෙදවුම් හඳුන්වා දීම සහ වෙළෙඳපළ පුළුල් කිරීම මගින් කෘෂිකර්මය සහ සත්ව පාලනය වැඩිදියුණු කිරීම. කෘෂිකාර්මික අපනයනයන් සඳහා බදු දිරිගැන්වීම් ද ලබාදෙනු ඇත.
- කෘෂිකාර්මික හා වාණිජ භෝග ව්‍යාප්තිය සඳහා අවශ්‍ය "ඉඩම් පරිහරණ සැලසුම්" සකස් කිරීම.
- කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායීතාව වර්ධනය කිරීමට ඉවහල් වන පරිදි ඉඩම්වල භාවිතය සීමා කරන්නා වූ යල්පැනගිය නීති සංශෝධනය කිරීම සඳහා ප්‍රමුඛතාව දෙනු ඇත.
- විවිධ ප්‍රශ්න නිසා වගා නොකර අත්හැර දමා ඇති පාරම්පරික ඉඩම් හා කුඹුරු නැවත වගා කිරීම සඳහා ගොවීන්ට අවශ්‍ය පහසුකම් සලසනු ඇත.
- වන සතුන් හේතුවෙන් හානියට පත්වන වගාවන් සහ භෝග නිෂ්පාදන නිසා පීඩාවට පත් ගොවීන් සඳහා රක්ෂණ ක්‍රමයක් අප හඳුන්වා දෙනු ඇත.
- ගොවියාට ස්ථාවර මිලක් ලබාදීම සඳහා ඔවුන්ගේ නිෂ්පාදන ගබඩා කිරීම වෙනුවෙන් තෙතමනය සහ උෂ්ණත්වය පාලනය කිරීමේ පහසුකම් සහිත "ප්‍රභාෂ්වර" ශීතාගාර හා අනෙකුත් පහසුකම්, දිවයින පුරා තෝරා ගත් ස්ථානවල පිහිටුවීම.
- කිරි, බිත්තර හා මස් නිෂ්පාදන ඉහළ දැමීම හා මිල පාලනය සඳහා ගොවිපළවල් නවීන තාක්ෂණය අනුව වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය හා ආධාර ලබාදීම. තවද, හිඟයකින් තොරව සැපයුම සහතික කිරීමත්, සහතික මිල හරහා අත්‍යාවශ්‍ය ආහාර අයිතම නිෂ්පාදනය දිරිමත් කිරීමත් සිදුකෙරෙනු ඇත.
- බිංදු ජල සම්පාදනය, ආරක්ෂිත ගෘහ තුළ බෝග වගාව, හරිතාගාර, ඩ්‍රෝන තාක්ෂණය, කෘත්‍රිම බුද්ධි තාක්ෂණය වැනි නවීන ක්‍රම කෘෂිකර්මාන්තයට හඳුන්වාදීම සඳහා බදු දිරිගැන්වීම් සහ අනුබල ලබාදීම.

- දැරිය හැකි ණය පහසුකම් ප්‍රවේශතා සහිතව සුළු හා මධ්‍යම පරිමාණ කෘෂි ව්‍යවසායකයින් දිරිගැන්වීම සඳහා ක්‍රමවේදයක් සැකසීම.

- තේ, රබර්, පොල්, උක්, කුරුඳු සහ අනෙකුත් අපනයන කෘෂි භෝගයන් ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය රාජ්‍ය අනුග්‍රහය අඛණ්ඩව ලබාදීම.

- වී ගොවියා සූරාකමින් පාරිභෝගිකයාට අධික මිලකට සහල් විකුණන මහා පරිමාණ වී මෝල් මාෆියාව පාලනය කොට සුළු හා මධ්‍යම පරිමාණ සහල් මෝල් හිමියන් සමග "ශක්ති සහල්" වැඩසටහන නැවත ක්‍රියාත්මක කරනු ඇත.

- අපි ශ්‍රී ලංකාවේ කුඩා තේ වතු හිමියන් මුහුණ දෙන අභියෝග පිළිගනිමු. ඔවුන්ගේ වත්මන් ගැටලු විසඳීම, ඔවුන්ගේ ඵලදායීතාව වැඩි දියුණු කිරීම සහ ඔවුන්ගේ දීර්ඝකාලීන සමෘද්ධිය සහතික කිරීම සඳහා ඉලක්කගත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අපි කැපවී සිටිමු.

- කුරුඳු සහ ගම්මිරිස් ද ඇතුළත් කුළුබඩු සඳහා වූ ජාත්‍යන්තර අපනයන වෙළෙඳපළ පුළුල් කිරීමට පියවර ගනු ඇති අතර, අගය එක් කළ නිෂ්පාදන හඳුන්වා දෙමින් නිෂ්පාදනයන්හි ප්‍රමිතිය සහ ගුණාත්මකභාවය ද සහතික කරනු පිණිස අවශ්‍ය තාක්ෂණය ලබාදීම පිණිස ක්‍රියාමාර්ග ගනු ඇත. වගාවන් ව්‍යාප්ත කරමින් පර්යේෂණ, තාක්ෂණය සහ කළමනාකරණය සඳහා නවීන තාක්ෂණය හඳුන්වා දෙනු ඇත.

## ඉඩම්, වාරිමාර්ග සහ ජල කළමණාකරණය

- ඉඩම් උපයෝජනය ප්‍රශස්තකරණය කරමින් වෙළෙඳපළ මෙහෙයුම් කටයුතු විධිමත් කරනු පිණිස රජය විසින් විස්තීර්ණ ජාතික ඉඩම් බැංකුවක් ස්ථාපනය කරනු ඇත. ඉඩම් යනු ආර්ථික සංවර්ධනයේ හා වෙළෙඳපළ ගතිකයන්හි තීරණාත්මක සාධකයක් වන්නේ යන කරුණ පිළිග නිමින්, මෙම මූලාරම්භය මගින් ඉඩම් තොරතුරු මධ්‍යගතකරණය කරමින්, කාර්යක්ෂම ඉඩම් වෙන් කිරීමකට අවශ්‍ය පහසුකම් සලසමින්, තිරසර සංවර්ධනයට සහාය ලබාදෙනු ඇත.

- රජයේ ඉඩම්වල පදිංචිව සිටින ඉඩම් අවසරපත්ලාභීන් වෙත වසර 5ක් ඇතුළත සින්නක්කර ඔප්පු ලබාදීමට පියවර ගනු ඇත.

- ජල මූලාශ්‍රයන් සහ ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය නීති පද්ධතිය ශක්තිමත් කරනු ලැබේ.

- රජය විසින් රට අභ්‍යන්තරයේ පවතින ජලාශයන්හි ධාරිතාව උපරිම මට්ටමකින් පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය කරන ආයෝජනයන් සිදු කරනු ඇත. අවශ්‍ය ජල ඉල්ලුම සාක්ෂාත් කර ගැනීම සඳහා සියලුම කුඩා, මධ්‍යම සහ ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය කර නඩත්තු කිරීම සහතික කරනු ඇත.

## ප්‍රවාහනය - මහාමාර්ග, නාවික සහ ගුවන

- පරිසර හිතකාමී, නූතන බස්රථ, දුම්රිය විද්‍යුත්කරණය, සැහැල්ලු දුම්රිය පද්ධතිය සහ සුහුරු තාක්ෂණයෙන් බලගැන්වුන Intelligent Transport Systems (ITS) සමග බහුවිධ පොදු ප්‍රවාහන පද්ධතියක් ගොඩනැගීම.

- මධ්‍යම අධිවේගී මාර්ගයේ වැඩ කටයුතු ඉක්මනින් නිම කිරීමට වගබලා ගනු ඇත. කහතුඩුව සිට පැල්මඩුල්ල දක්වා රුවන්පුර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අපගේ ප්‍රධාන ප්‍රවාහන ජාලයේ මූලික අංගයක් ලෙස සළකන බැවින්, එහි ඉදිකිරිම් කටයුතු අදියර පදනමින් සම්පූර්ණ කෙරෙනු ඇත. ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.

- වර්තමාන රජය විසින් නතර කරන ලද කැලණිවැලි දුම්රිය මාර්ගය ඇතුළු දුම්රිය නවීකරණ ව්‍යාපෘති කඩිනම් කෙරෙනු ඇත.

- බහු මංතීරු නිදහස් ප්‍රවාහන (Multi-Lane Free Flow - MLFF) පද්ධතියක් හඳුන්වා දීමෙන් අධිවේගී මාර්ගවල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම.

- කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ තරගකාරීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (SLTB) වෙනුවෙන් ඉලක්කගත වැඩසටහනක් දියත් කෙරෙනු ඇත. එමඟින් පෞද්ගලික අංශයේ ප්‍රවාහන සේවා සමඟ තරඟකාරීව සේවා සැපයීමේ හැකියාව ලඟා කර ගනු ඇත.

- සංචාරක කර්මාන්තයට විශාල සහයක් වන කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ දෙවන පර්යන්තය කඩිනමින් නිම කිරීමට ප්‍රමුඛතාව දීම සහ රට තුළ පවතින දේශීය ගුවන් තොටුපළවල් සිවිල් ගුවන් තොටුපළවල් බවට පරිවර්තනය කිරීම.

- ශ්‍රී ලංකාවේ අනන්‍ය උපායමාර්ගික පිහිටීම සැළකිල්ලට ගනිමින්, වරායන් සංවර්ධනය කිරීම සඳහා සහභාගිත්වය ලබාදෙන ලෙස පෞද්ගලික අංශයට ආරාධනා කරන්නෙමු.

## ධීවර හා ජලජ සම්පත්

නීල ආර්ථික (Blue economy) මූලධර්ම මත පදනම්ව ශ්‍රී ලංකා මුහුදු සීමාව තුළ ජලජ සම්පත් උපරිම උපයෝජනය සිදු කරමින් රාජ්‍ය - පෞද්ගලික අංශ හවුල්කාරිත්වයන් (PPP) හරහා තිරසර ආර්ථික කටයුතු ප්‍රවර්ධනය කරන්නෙමු.

- ධීවර ප්‍රජාවගේ ආර්ථික ශක්තිය නැංවීම උදෙසා රාජ්‍ය හා පෞද්ගලික බැංකු මාර්ගයෙන් ව්‍යවසායකයින්ට අඩු පොළී ණය යෝජනා ක්‍රමයක් ඇති කිරීම හා ඔවුන්ගේ ව්‍යවසායකත්ව හැකියාවන් වර්ධනය පිණිස විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරනු ඇත.

- කෘත්‍රිම බුද්ධිය (AI) හා Internet of Things (IoT)

වැනි තාක්ෂණයන් භාවිතය තුළින් ගැඹුරු මුහුදේ මත්ස්‍ය අස්වැන්න පුරෝකථන වැඩපිළිවෙළ දියුණු කිරීම හා එම තොරතුරු ධීවර ජනතාව වෙත එසැණින් සන්නිවේදනය සඳහා අවශ්‍ය සරල ක්‍රම සැකසීම සිදු කරනු ඇත.

- ධීවර සංචාරක කර්මාන්තය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම හා ඒ මඟින් ධීවර ප්‍රජාවගේ ආර්ථික ශක්තීන් වැඩි දියුණු කිරීමට විකල්ප ආදායම් මාර්ග ඇති කරයි. ධීවර පවුල්වල කාන්තාවන් විකල්ප ව්‍යවසායකත්වයන් සඳහා යොමු කිරීම වෙනුවෙන් පුහුණු කිරීම සහ දිරි ගැන්වීම සිදු කරනු ඇත.

- දිවයින පුරා මත්ස්‍ය සම්පත් බෙදා හැරීම විධිමත් කිරීම තුළින්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක ජීවත් වන්නන්ට අළුත් මාළු ලබා ගැනීමේ හැකියාව ඇති කිරීම.

- රට අභ්‍යන්තරයේ පවත්නා ජල මාර්ගයන්හි ප්‍රයෝජනයට නොගත් විභවතාවන් අවබෝධ කරගනිමින්, ජාතික ධීවර කර්මාන්තයේ ප්‍රධාන සංරචකයක් ලෙස මිරිදිය ධීවර කර්මාන්තය නඟා සිටුවීමට රජය විසින් අදහස් කරනු ලබයි.

- සරල නීති රෙගුලාසි සහ ඉලක්කගත අලෙවිකරණ ක්‍රමෝපායයන් ද ඇතුළත් වර්ධනය කරන ලද සහාය උපායමාර්ග හරහා විසිතුරු මත්ස්‍ය කර්මාන්තය සහ එහි අපනයනයන් සඳහා අවශ්‍ය පහසුකම් සලසනු ඇත.

- විදේශීය අනවසර ධීවර යාත්‍රා මඟින් සිදු කෙරෙන නීති විරෝධී ක්‍රියාවන් රාජ්‍යතාන්ත්‍රිකව විසඳීම හා ඒවා නිරීක්ෂණය පිණිස සන්නිවේදන හා තාක්ෂණික පහසුකම් වැඩි දියුණු කිරීම සිදු කරනු ඇත.

- ධීවර වරාය සහ නැංගුරම් තොටුපළවල් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ආයෝජන ලබා දීමට ප්‍රමුඛතාව ලබා දෙනු ඇත.

## සංචාරක කර්මාන්තය

- සමගි ජන බලවේගය විසින් සකස් කර ඇති "ශ්‍රී ලංකාව සඳහා වූ සංචාරක ප්‍රතිපත්තිය: තිරසර හා සියල්ලන් අන්තර්ගත වර්ධනයක් සඳහා වූ සැලැස්මක් (Tourism Policy for Sri Lanka( A Blueprint for Sustainable and Inclusive Growth)" ප්‍රතිපත්තියේ සඳහන් සවිස්තරාත්මක නිර්දේශ ක්‍රියාත්මක කරමින් ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රය රටේ ප්‍රමුඛතම විදේශ විනිමය ඉපයීමේ මාර්ගය බවට පත් කිරීම සඳහා පියවර ගැනීම රජයේ ප්‍රමුඛ වගකීමක් ලෙස සලකනු ඇත.

- වර්තමාන රජය විසින් අත්සන් කර ඇති, දූෂිත " VFS වීසා ගිවිසුම" අවලංගු කරන අතර විදේශීය සංචාරකයන් සඳහා පහසුවෙන් අඩු මුදලකට වීසා ලබා ගැනීම සඳහා අවශ්‍ය නවීන පද්ධතියක් ගොඩනගනු ලැබේ. එසේම, ශ්‍රී ලංකාවේ සිදු වූ විශාලතම දූෂණයන් අතර ප්‍රමුඛ වන එම ගණුදෙණුවට වගකිවයුත්තන් නීතිය ඉදිරියට ගෙන යනු ඇත.

- රටවල් 100 ක පුරවැසියන්ට පැමිණීමට පෙර ලබාගත යුතුවන වීසා බලපත්‍රයක් අවශ්‍ය නොවන පරිදි මාසයක කාලයක් දක්වා ශ්‍රී ලංකාවට පැමිණීමට හැකි වන පරිදි වීසා රහිතව දිවයිනට ඇතුළුවීමේ වැඩසටහනක් රජය විසින් ක්‍රියාත්මක කරනු ඇත.

- විදේශයන්හි ජීවත්වන ශ්‍රී ලාංකික සම්භවයක් ඇති පුද්ගලයින්ට රටට පහසුවෙන් පිවිසීමට පහසුකම් සැලසීම සඳහා විදේශගත ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ වැඩසටහන (Overseas Citizens of Sri Lanka Programme) ක්‍රියාත්මක කිරීම කඩිනම් කොට ඔවුන්ට ශ්‍රී ලංකාවේ නේවාසිකයන් වශයෙන් කටයුතු කිරීම පහසු කරන්නෙමු.

- කොළඹ නගරය දකුණු ආසියාවේ අලංකාරම සහ ආයෝජකයන්ට හිතකර අගනුවර බවට පත් කරමින්, වසර පුරා සංචාරකයන් ආකර්ෂණය කර ගැනීමට නායකත්වය සපයනු ඇත. මෙම නාගරික පුනර්ජීවනය, සංචාරක වෙළෙඳපළ විවිධාංගීකරණය සමඟ සමගාමීව, නගරය කලාපීය ව්‍යාපාරික හා විනෝද කේන්ද්‍රස්ථානයක් ලෙස ස්ථානගත කරමින්, වසර පුරා සංචාරක කර්මාන්තයේ වර්ධනයට උත්තේජන සපයනු ඇත.

- පරිසර හිතකාමී සංකල්පවලට මූලිකත්වය ලබා දෙමින් ප්‍රාදේශීය සංචාරක ව්‍යාපාරය නැවත බල ගන්වන අතරම ස්වභාවික වාසස්ථාන ආරක්ෂා කරන්නාවූ තිරසර පිළිවෙත් සහතික කරමින් දිවියන් නැරඹීම විශේෂ කොටගත් ප්‍රමුඛ පෙළේ වනජීවී ගමනාන්තයක් ලෙස ද ශ්‍රී ලංකාව සංචාරක ක්ෂේත්‍රය තුල ප්‍රවර්ධනය කරනු ඇත.

- භාෂා ප්‍රවීණතාවය සහ වෘත්තීය නිපුණතා සංවර්ධනය කෙරෙහි ද අවධානය යොමු කරවමින් රාජ්‍ය-පෞද්ගලික අංශ හවුල්කාරිත්වය හරහා විධිමත් හා අවිධිමත් යන දෙඅංශයේම සංචාරක කර්මාන්තය සඳහා විස්තීර්ණ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

## විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ

- කෘත්‍රිම බුද්ධිය (Artificial Intelligence) ශ්‍රී ලංකාව තුළ ප්‍රවර්ධනය කිරීම සඳහා පර්යේෂණ සහ සංවර්ධන (Research & Development) සහ විෂය මාලා සංවර්ධනය උදෙසා ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ රාජ්‍ය නොවන විශ්ව විද්‍යාලවලට, අයදුම් කොට ලබා ගත හැකි පරිදි, රජය විසින් වසරකට රුපියල් බිලියන 05ක වටිනාකමින් යුත් "රාජ්‍ය පර්යේෂණ අරමුදල" පිහිටුවනු ඇත.

- වාණිජමය වශයෙන් වැදගත් පර්යේෂණයන්හි නියැලෙන විශ්වවිද්‍යාල හා ඉන් බැහැර තරුණ පර්යේෂණ කණ්ඩායම්වලට සහයෝගය ලබා දීම සඳහා ව්‍යාපාර පර්යේෂණ පහසුකම් සලසන

මධ්‍යස්ථානයක් (Business/ Research Incubator) හෝමාගම තාක්ෂණ නගරය ආශ්‍රිතව නිර්මාණය කෙරෙනු ඇත.

- දියුණු රටවල සිදුවන්නාක් සේ, විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් තමන්ගේ උපාධි අවශ්‍යතාවන් වෙනුවෙන් කරන පර්යේෂණ අතුරින් හොඳම පර්යේෂණ තෝරාගෙන ඒවා රටේ ආර්ථිකයට වැදගත් වන ව්‍යාපෘති සේ ක්‍රියාත්මක කිරීමේ හැකියාව සළකා බැලෙනු ඇත.

- අපි නවීනතම තාක්ෂණයෙන් යුත් තොරතුරු තාක්ෂණ උද්‍යාන 25ක් ස්ථාපිත කිරීමට අපේක්ෂා කරන්නෙමු.

## කර්මාන්ත අංශය

- මිල්ලෑව, මිල්ලනිය සහ බිංගිරිය අපනයන සැකසුම් කලාපවල කටයුතු කඩිනම් කර, ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්කවල උපාය මාර්ගිකව පිහිටි නවීනතම තාක්ෂණයෙන් යුත් නව කාර්මික කලාප 25 ක් ස්ථාපිත කරනු ඇත. සමබර ප්‍රාදේශීය සංවර්ධනය සහතික කරමින් සහ දිවයින පුරා රැකියා අවස්ථා නිර්මාණය කිරීම මින් අරමුණු කෙරේ. මෙම සෑම කලාපයකටම නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් කඩිනමින් ආරම්භ කරනු ඇත. කර්මාන්ත ක්‍රමයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 341 ක් දක්වා ව්‍යාප්ත වනු ඇත.

- ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් සහ තාක්ෂණික දක්ෂතා ප්‍රයෝජනයට ගනිමින් තිරසාර තාක්ෂණයේ නායකත්වය සඳහා දිවයින පුරා 'හරිත තාක්ෂණ නවෝත්පාදන මධ්‍යස්ථාන (Green Tech Innovation Hub)' ජාලයක් නිර්මාණය කිරීම. මෙම මුලපිරීම මගින් විදේශ ආයෝජන ආකර්ෂණය කර ගනිමින් ඉහළ නිපුණතා සහිත රැකියා නිර්මාණය කරන අතරම ගෝලීය වෙළඳපොළ සඳහා පරිසර හිතකාමී විසඳුම්වල පුරෝගාමියෙකු ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කරනු ඇත.

- "මිලියනයක නව ව්‍යවසාය" ආරම්භයන් තහවුරු කිරීම සඳහා '18+ නව ව්‍යවසාය ව්‍යාපෘතිය' ක්‍රියාත්මක කරනු ඇත. මෙම ව්‍යාපෘතියට තරුණ ව්‍යවසායකයින් මෙන්ම විශේෂයෙන් නව උපාධිධාරීන් ද ඇතුළත් වනු ඇති අතර ඔවුනට ව්‍යාපාර ආරම්භක ණය, උපදේශනය සහ අත්‍යාවශ්‍ය මගපෙන්වීම සමඟින් සවිබල ගැන්වෙනු ඇත.

- නව කර්මාන්ත ලියාපදිංචි කිරීම සඳහා සරල කරන ලද 'බහුකාර්ය සේවා ස්ථාන' (One-Stop Shop) මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම හා එමගින් ව්‍යවසායකයින්ට අවශ්‍ය සියලු රජයේ අනුමැතීන් එක ස්ථානයකින් ලබා ගනිමින් කාර්යක්ෂමව තම ව්‍යාපාර ලියාපදිංචි කිරීමට හැකියාව ලබාදීම. මෙම මුලපිරීම මගින් පරිපාලනමය බාධක සැලකිය යුතු ලෙස අවම කරනු ඇති අතර, නීති රීති ලිහිල් කර ශ්‍රී ලංකාවේ නව ව්‍යවසායන් ආරම්භ කිරීමේ ක්‍රියාවලිය වේගවත් කරනු ඇත.

- පරම්පරාගත නිෂ්පාදන දැනුම ඔවුන්ගේ සංස්කෘතික උරුමයේ කොටසක් ලෙස ආරක්ෂා කරන ශ්‍රී ලංකාවේ ගෘහ, ග්‍රාමීය සහ සම්ප්‍රදායික කර්මාන්ත සුවිශේෂී අංශයන් ලෙස පිළිගැනේ. මෙම කර්මාන්තවලට තෝරාගත් වෙළඳපල තුළ දියුණු වීමට ඉඩ සලසමින්, වැඩිදියුණු කළ පහසුකම්, වෙළඳපල ස්ථානගත කිරීමේ විශේෂඥතාව, පිරිවැය ඵලදායී නිෂ්පාදන උපායමාර්ග, ඇසුරුම් වැඩිදියුණු කිරීම් සහ ප්‍රාග්ධනය අත්පත් කර ගැනීම සඳහා මූල්‍ය ආධාර ලබාදීම වැනි ඉලක්කගත සහය ලබා දෙන්නෙමු.

- සමුපකාර මුලුමනින්ම නිර්-දේශපාලනීකරණය කෙරෙනු ඇති අතර නීති ප්‍රතිසංස්කරණ මගින් සමුපකාර බැංකු ශක්තිමත් කර සමුපකාර ඉතිරි කිරීම් ආරක්ෂා කරනු ඇත. මෙම ප්‍රතිසංස්කරණ මෙන්ම දායක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සහ තාක්ෂණික නවීකරණය තුළින් ශ්‍රී ලංකාවේ සමුපකාර ක්ෂේත්‍රය පුනර්ජීවනය කරන්නෙමු. මෙම ක්‍රියාමාර්ග මඟින් බිම් මට්ටමේ තිරසාර ආර්ථික වර්ධනයක් ඇති කිරීම හරහා මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, ව්‍යාපාර ආකෘති විවිධාංගීකරණය කිරීම සහ සමුපකාර සහ ඔවුන්ගේ ප්‍රජාවන් සඳහා අන්‍යෝන්‍ය ප්‍රතිලාභ නිර්මාණය කිරීම අරමුණු කෙරේ.

- ආර්ථිකය පුරා නවෝත්පාදන, වෙළඳ සන්නාම, බුද්ධිමය දේපළ අයිතිවාසිකම් සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වඩාත් හොඳින් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා පුළුල් ආයතනික ප්‍රතිසංස්කරණ සිදු කිරීම සහ නීති යාවත්කාලීන කිරීම සිදු කරනු ඇත.

- අපි අපගේ ආර්ථිකයට ඇඟලුම් ක්ෂේත්‍රය විසින් සිදු කරන ලද අගනා දායකත්වය අගය කරමු. ඒ අනුව, සේවකයින් සහ කර්මාන්තය යන දෙකෙහිම යහපැවැත්ම සුරක්ෂිත කිරීම අරමුණු කරගත් විශේෂ ප්‍රඥප්තියක් සකස් කොට ක්‍රියාත්මක කරන්නෙමු. මෙම ප්‍රඥප්තිය, ගෝලීය නිෂ්පාදන වටිනාකම් දාමයේ ධාවක බලයක් ලෙස පුහුණු ශ්‍රමයේ වැදගත්කම අවධාරණය කරනු ඇත. මෙය සැලකිල්ලට ගනිමින්, සියලු පාර්ශවකරුවන්ගේ සහයෝගයෙන් ඇඟලුම් ක්ෂේත්‍රයේ සේවකයන්ට රක්ෂණ සහ ළමා සුරැකුම් පහසුකම් ලබා දීමට ද මැදිහත්වන්නෙමු.

## ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (MSME) අංශය

- ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය මුහුණ පා සිටින තීරණාත්මක තත්ත්වය වටහා ගත් පළමු දේශපාලන පක්ෂය සමගි ජන බලවේගයයි. පාර්ලිමේන්තුව තුළ මෙන්ම ඉන් පිටතදී ද, මෙම අංශයේ වත්මන් තත්ත්වය පිළිබඳ නොකඩවා හඬ නැගුවෙමු. තවද, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ නියෝජිතයන් හා ආසියානු සංවර්ධන බැංකුව (ADB), ලෝක බැංකුව (WB), යුරෝපා සංගමය (EU) සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) වැනි ප්‍රධාන ජාත්‍යන්තර මූල්‍ය ආයතන අතර රැස්වීම් පවත්වමින් ඔවුන් වෙත සහාය හා ගැටලු සඳහා විසඳුම් ලබාදීමේ ශක්‍යතාවයන්

විමසා බලනු පිණිස පහසුකම් සලසන්නෙමු.

- සමගි ජන බලවේගය පාර්ශ්වයෙන් එල්ල වූ පීඩනයට ප්‍රතිචාරීව, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයට යම් සහනයක් සලසමින් රජය විසින් 2024 දෙසැම්බර් මස 15 වන දින දක්වා පරාටේ නීතිය බල ගැන්වීම අත්හිටුවන ලදි. අනාගත රජයක් යටතේ මෙම අත්හිටවුම් කාලය සැළකිය යුතු කාල පරිච්ඡේදයකින් දීර්ඝ කරන්නෙමු. මෙයට අමතරව, සියලු රාජ්‍ය හා වාණිජ බැංකුවල විශේෂිත ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ණය දෙපාර්තමේන්තු ස්ථාපනය කිරීම අනිවාර්ය කරන්නෙමු. මෙම දෙපාර්තමේන්තු විසින් එකින් එක සළකා බැලීමේ පදනමින් ඔවුන්ගේ ණය තත්ත්වයන් විශ්ලේෂණය කරනු ඇත. මහ බැංකුවේ මඟ පෙන්වීම් හරහා, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයට තිරසර සහායක් ලබාදෙනු ලබන බවට වගබලා ගනිමින් අහිතකර බලපෑම්වලට ලක්ව ඇති ව්‍යාපාරයන් සඳහා සහන පොළී අනුපාතයන් සහිතව දැනට පවත්නා ණය, දීර්ඝ කාලීන ණය බවට පරිවර්තනය කිරීමට උපදෙස් නිකුත් කෙරෙනු ඇත.
- ටුක් ටුක්: ත්‍රිරෝද රථ රියැදුරන්ගේ දෛනික පෙට්‍රල් පිරිවැය ඉතිරි කරමින් ත්‍රිරෝද රථවල දහන එන්ජින්, විදුලි එන්ජින් බවට පරිවර්තනය කිරීම සඳහා සහන පොළී ණය පහසුකමක් ලබාදෙන්නෙමු. මෙම ණය යෝජනා ක්‍රමය බැංකු පද්ධතිය හරහා පාලනය කෙරෙනු ඇත.
- සමෘද්ධිමත් ලෙස වැඩි වර්ධනය වන අංශයක් නිර්මාණය කොට සැළකිය යුතු ව්‍යවසායකයන් සංඛ්‍යාවක් නිර්මාණය කිරීමේ අභිමතාර්ථය සාක්ෂාත් කරගනු පිණිස අදාළ සියලු සාධක ඒකාබද්ධ කරමින් සියලු පාර්ශ්වකරුවන්ගේ අදහස් විමසීම් හරහා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් ගොඩනගන්නෙමු.

## මැණික් හා ස්වර්ණාභරණ අංශය

- කැණීම් බලපත්‍ර පහසු කිරීම සඳහා කාර්යක්ෂම, වේගවත් සහ විනිවිද පෙනෙන පද්ධතියක් ස්ථාපිත කරයි.
- කැණීම් ක්‍රියාකාරකම්වල නවීන තාක්ෂණය අත්පත් කරගැනීමට කුඩා පරිමාණ පතල් කරුවන්ට මූල්‍ය පහසුකම් සැපයීම.
- සාධාරණ හා සමානාත්මතාවයකින් යුතුව කැණීම් සඳහා වැඩි බිම් ප්‍රමාණයක් විවෘත කිරීම.
- ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් සිදුකරනු ලබන කිසිදු මැදිහත්වීමකින් තොරව සිදුවන වඩාත් පහසු අපනයන ගලනයක් සහතික කරනු පිණිස ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ප්‍රතිව්‍යුහගත කෙරෙනු ඇත. සියලුම අපනයනකරුවන්ට තම රේගු ප්‍රකාශන ඉදිරිපත් කිරීමට සහ තායිලන්තය සහ හොංකොං හා සමානව තම කාර්යාලවලින් කෙලින්ම භාණ්ඩ අපනයනය කිරීමට රේගු මාර්ගගත වේදිකාවට ඍජු ප්‍රවේශයක් ලැබෙනු ඇත.
- සියලුම ශ්‍රී ලාංකිකයන්ට සම්පූර්ණයෙන්ම මාර්ගගත ක්‍රමවේද හරහා කුරියර් සහ තැපැල් සේවා භාවිතා කරමින් ඵලදායී හා අපනයන යාන්ත්‍රණයන් හරහා ලෝකයේ අනෙකුත් රටවල් සමඟ මැණික් හා ස්වර්ණාභරණ වෙළඳාමේ නිරත විය හැකි වනු ඇත.
- කර්මාන්තයේ ආදායම් බදු තක්සේරුව පිරිවැටුම මත පදනම්ව සිදු කළ යුතුය - දැනට ශුද්ධ ලාභය මත අදාළ වන 30% බද්දක් අය කිරීම පිළිබඳ සළකා බලනු ලැබේ.
- අගය එකතු කිරීම සහ ප්‍රති-අපනයනය සඳහා ශ්‍රී ලංකාවට වැඩි වැඩියෙන් මැණික් ඉල්ලීම් ලැබීම දිරිගන්වනු පිණිස මැණික් ආනයනය මත ක්‍රියාත්මක එකතු කළ අගය මත බද්ද සහ සමාජ ආරක්ෂණ බද්ද අහෝසි කිරීම පිළිබඳ සළකා බලනු ලැබේ. අතින් රැගෙන එන මැණික් පාර්සල් ආනයනයේදී පාර්සලයකට ඇමරිකානු ඩොලර් 200 බැගින් වූ ගාස්තු ක්‍රමය නැවත ස්ථාපනය කිරීම පිළිබඳ සළකා බලනු ලැබේ.
- විදේශ මුදල් සඳහා සිදුකරනු ලබන සියලුම මැණික් හා ස්වර්ණාභරණ විකිණීම් එකතුකළ අගය මත බද්දෙන් නිදහස් කරනු ලැබේ.
- නීත්‍යානුකූල ස්වර්ණාභරණ නිෂ්පාදකයින් සම්බන්ධයෙන් ගත්කල ඔවුන්ගේ ගන රන් ආනයන සඳහා ගෙවීම් කෙලින්ම හෝ වක්‍රව සිදුකරන ලද අපනයන කාර්යයක කොටසක් ලෙස උපයන ලද විදේශ මුදල් මගින් සිදු කරන විට ඒ සඳහා තීරු බදු ඉවත් කිරීමට යෝජනා කරමු.
- නිමි මැණික් හා ස්වර්ණාභරණ සඳහා අගය එකතු කිරීමේ හා අපනයන අවස්ථා ඉහළ නැංවෙන පරිදි මෙම අයිතම මත තීරු බදු ඉවත් කෙරෙනු ඇත.
- ඒවා ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානවලට වඩාත් ආසන්න කරමින් එම අංශයේ දක්ෂතා සංවර්ධනය සහතික කරනු පිණිස මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය සම්පූර්ණයෙන්ම ප්‍රතිව්‍යුහගත කෙරෙනු ඇත.

## ඉදිකිරීම් අංශය

- සාධාරණ සහ නවෝත්පාදනීය ඉදිකිරීම් කර්මාන්තයක් නිර්මාණය කරනු පිණිස ‘Build Sri Lanka Fair ’ වැඩසටහන දියත් කෙරෙනු ඇත. මෙම විස්තීර්ණ ප්‍රතිපත්තිය මගින් කුඩා, මධ්‍ය හා මහා පරිමාණ ව්‍යාපාරයන් අතර සාධාරණ තරඟකාරීත්වයක් සහතික කරමින් කොන්ත්‍රාත්කරුවන් ශ්‍රේණිගත කිරීම නැවත හඳුන්වා දෙනු ඇත. ගොඩනැගිලි තොරතුරු මාදිලිකරණය ( Building Information Modeling) වැනි දියුණු තාක්ෂණයන් යොදා ගැනීමෙහිලා නායකත්වය ගනු පිණිස ඒ සඳහා පර්යේෂණ හා නවෝත්පාදන අංශයක් ද ස්ථාපනය කෙරෙනු ඇත. මෙම වෙනස්කම් මගින් ඉදිකිරීම් ක්ෂේත්‍රය නවීකරණය කිරීමත්, කාර්යක්ෂම කිරීමත් අපේක්ෂා කරන අතර  දේශීයව නිෂ්පාදිත අමුද්‍රව්‍ය භාවිතා කිරීමට හැකි පරිසරයක් ද නිර්මාණය කරනු ඇත.

- ආරවුල් විසඳීම විධිමත් කිරීම පිණිසත්, ඉදිකිරීම් අංශයේ නියාමන අනුකූලතාව වැඩි දියුණු කිරීම පිණිසත් "Swift Build" Smart Resolve වැඩසටහන ක්‍රියාත්මක කෙරෙනු ඇත. මෙම වැඩසටහන මගින් ආරවුල් කාර්යක්ෂමව සමථයකට පත් කිරීම සඳහා ඉදිකිරීම් ව්‍යාපෘති පිළිබඳ ස්ථාවර උපදේශක කමිටුවක් (SACCP) සහ ඉහළ වටිනාකමක් ඇති ව්‍යාපෘති අධීක්ෂණය කිරීම සඳහා ඉදිකිරීම් ව්‍යාපෘති පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුවක් (NCCP) හඳුන්වා දෙනු ඇත. එමගින් සම්මත ලංසු ලේඛනවලට අනුකූල වීම, බලාත්මක කිරීම, ඒකරූපී බව සහතික කිරීම සහ ගැටුම් අවම කිරීම සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) වෙත බලය ලබා දෙනු ඇත.

- නවතා දමන ලද ව්‍යාපෘති උපායමාර්ගික සමාලෝචනයක් සහිතව නැවත ආරම්භ කිරීම පිරිවැය ඵලදායී විසඳුම් ලබාදෙනු ලබන බවට සහතික කරමින් සහ කොන්ත්‍රාත්කරුවන් සහ රජය මත තවදුරටත් මූල්‍ය බර පැටවීමකින් තොරව අත්‍යවශ්‍ය නොවන ව්‍යාපෘති අවලංගු කිරීම හෝ ප්‍රතිව්‍යුහගතකරණය සිදු කරමින් මෙම අත්‍යාවශ්‍ය ව්‍යාපෘති නැවත ආරම්භ කරනු පිණිස අනාගත රජය විසින් අරමුදල් වෙන් කරනු ඇත.

- ඉදිකිරීම් සේවා සහ නිෂ්පාදන අපනයනය ප්‍රවර්ධනය රජය විසින් අපනයන කර්මාන්තයක් වශයෙන් ඉදිකිරීම් අංශය ප්‍රවර්ධනය කිරීමේ කාර්යයට ප්‍රමුඛතාව ලබාදිය යුතුය. අන්තර් ජාතික වෙළෙඳාම් සහතිකකරණය (Cross-Border Guarantees) සඳහා අවශ්‍ය පහසුකම්කරණය, රාජ්‍ය තාන්ත්‍රික සහාය ලබාදීම සහ අපනයන ප්‍රවර්ධනය ආරම්භ කිරීම මගින් මෙය ක්‍රියාත්මක කළ හැකිය.

- සැපයුම් දාමය නවීකරණය කරමින් ඉදිකිරීම් යෙදවුම් නිෂ්පාදන දේශීයකරණය සිදු කරනු ඇත.

- සම බිමක ක්‍රියාත්මක වීමේ අවකාශ සහතික කරමින් සාධාරණ තරඟකාරීත්වයක් සහ නියාමන බලගැන්වීමක් සඳහා අවකාශ විවර කරනු ඇත .

- රඳවා ගැනීමේ අරමුදල් වෙනුවට ඇපකර හෝ බැඳුම්කර ස්ථානගත කරමින් ගිවිසුම්ගත වැඩකටයුතු 60%කින් සම්පූර්ණ වූ පසු රඳවාගත් මුදල් මුදා හැරීම සේවායෝජකයන් විසින් අනිවාර්යයෙන් සිදු කළ යුතු බවට රජය විසින් විධිවිධාන පනවනු ඇත.

## විදුලි බලය සහ බලශක්තිය

- පාරිභෝගිකයින්ට සාධාරණ සහ තරඟකාරී මිල ගණන් යටතේ විදුලිය සැපයීම සහතික කිරීම සඳහා විදුලිබල අංශයේ දූෂණය සහ අකාර්යක්ෂමතාව තුරන් කිරීමට අවශ්‍ය නීති සංශෝධන සහ පරිපාලන වෙනස්කම් සිදු කෙරෙනු ඇත.

- විදුලිය, ඛනිජ තෙල් සහ ගෑස් යන ක්ෂේත්‍රවල දේශීය හා විදේශීය ආයෝජන දිරිගැන්වෙන අතර, සම්පූර්ණයෙන්ම දූෂණයෙන් තොර සහ කාර්යක්ෂම ලෙස විදුලිය මිලදී ගැනීම සඳහා ලෝක සම්මතයන්ට අනුකූල ක්‍රමයන් හඳුන්වා දෙනු ඇත.

- දැනටමත් ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් 1,300ක් එකතු කර ඇති "සූර්ය බලශක්ති සටන" (Battle for Solar Energy) ව්‍යාපෘතිය තවදුරටත් ප්‍රවර්ධනය කෙරේ. සහන පොලී අනුපාත යටතේ "සූර්ය බලාගාර" ඉදි කිරීමට නිවාස හිමියන් සහ කර්මාන්තකරුවන් දිරිගන්වනු ලැබේ. වසර 5ක් තුළ නිවාස මිලියනයක් සූර්ය බලශක්තියෙන් සවිබල ගැන්වීම මෙහි අරමුණ වේ.

- මෙගාවොට් 1,200ක අක්වෙරළ (Off-shore) ඉදිකරන සුළං විදුලි ව්‍යාපෘතියක් සඳහා ප්‍රමුඛතාව ලබාදෙන අතර රට තුළ (On-shore) සුළං විදුලි බලය සහ සූර්ය විදුලි බලය ප්‍රවර්ධනය කිරීම සඳහා විනිවිදභාවයෙන් යුතු තරඟකාරී ක්‍රමවේදයන් හඳුන්වා දෙනු ඇත. එමගින් දේශීය සහ විදේශීය ආයෝජකයන් දිරිමත් කිරීම අපේක්ෂා කරනු ලැබේ.

- ශ්‍රී ලංකාවේ විදුලි පද්ධතිය වසර 05ක් තුළ සුහුරු පද්ධතියක් (Smart Grid) බවට පත් කරනු ඇත.

- දැනට පවතින තාප බලාගාර ද්‍රවීකෘත ස්වභාවික වායු මගින් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නවීකරණයන් වසර 02ක් තුළ සම්පූර්ණ කරන අතර දේශීය බලශක්ති අවශ්‍යතා උදෙසා ස්වභාවික වායු, ද්‍රවීකෘත ස්වාභාවික වායු සහ සම්පීඩිත ස්වාභාවික වායු භාවිතා කිරීම සඳහා අවශ්‍ය වන යටිතල පහසුකම් රාජ්‍ය සහ පෞද්ගලික මැදිහත්වීමෙන් ලබා දෙනු ඇත.

- සුළං සහ සූර්ය විදුලි ක්ෂේත්‍ර ඇතුළත් පුනර්ජනීනය බලශක්ති ප්‍රභවයන්වලට අවශ්‍ය යන්ත්‍රෝපකරණ නිපදවීම සහ නඩත්තු කිරීමට අදාළ පහසුකම් රට තුළ ඇතිකිරීමට අවශ්‍ය කටයුතු රාජ්‍ය සහ පෞද්ගලික අංශවල මැදිහත් වීමෙන් සිදු කරනු ඇත.

- 2024 අංක 36 දරණ විදුලිබල පනත තුළ අන්තර්ගත විදුලි සේවකයන්ගේ අයිතිවාසිකම්වලට එරෙහි සහ පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම්වලට එරෙහි ප්‍රතිපාදන ඉවත් කර, කාර්යක්ෂම සුහුරු විදුලි පද්ධතියක් රට තුළ ගොඩනැගීමට ප්‍රමුඛතාව ලබාදෙනු ඇත.

- ශ්‍රී ලංකාවේ තිරසර බලශක්ති විභවය සැළකිල්ලට ගත් කල අපගේ දේශීය අවශ්‍යතා ඉක්මවා ගොස් අපනයනය කිරීමේ සුභදායී අවස්ථාවක් පවතී. හරිත හයිඩ්‍රජන් නිෂ්පාදන කාර්යයෙහි නිරත වෙමින් ඒ සඳහා සෘජු විදේශ ආයෝජන වෙත ආරාධනා කරන්නෙමු.

- ප්‍රාදේශීය බලශක්ති සම්බන්ධතා වැඩසටහන් ක්‍රියාත්මක කරන්නෙමු.

# සෑම පුරවැසියෙකුම බලගැන්වීම



“අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා සහ සමාජ සේවා සඳහා සෑම පුරවැසියෙකුටම සමාන ප්‍රවේශයක් සහතික කිරීමට කැපවී සිටින අතර, “සක්වල” සහ “හුස්ම” වැනි නව්‍ය ව්‍යාපෘතීන්වල සහාය ලබා ගනිමින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය මෙන්ම කිසිදු ජන කණ්ඩායමක් අත් නොහැරෙන සේ, සෑම පුද්ගලයෙකුටම සාර්ථක විය හැකි ස්වයංපෝෂිත සමාජයක් ගොඩනගමු.”

## අධ්‍යාපනය, වෘත්තීය පුහුණුව සහ තාරුණ්‍යය

අධ්‍යාපනය යනු මූලික අයිතිවාසිකමකි. මානව ප්‍රාග්ධනය අපගේ ප්‍රමුඛතාවයි.

- ජාතියේ මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම උදෙසා ගුරුවරුන් විසින් ඉටුකරනු ලබන තීරණාත්මක කාර්යභාරය පිළිගනිමින්, රජය ශ්‍රී ලංකාව පුරා සියලුම ගුරුවරුන්ට නොමිලේ පොදු ප්‍රවාහන පහසුකම් සපයනු ඇත.

- අධ්‍යාපන ක්ෂේත්‍රයේ දීර්ඝ කාලයක් තිස්සේ පවතින වැටුප්, විශ්‍රාම වැටුප් සහ සේවා ගැටලු විසඳීම සඳහා 2025 ජනවාරි මාසයට පෙර ප්‍රතිපත්තිමය තීරණ ගනිමින් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම.

- ශ්‍රී ලංකාවේ සියලුම පාසල්වලට 100% විදුලිය, ජල පහසුකම් සහ භෞතික සම්පත් සැපයීමෙන් සෑම පාසලක්ම සුහුරු පාසලක් බවට පත් කිරීම සඳහා මාර්ග සිතියමක් සකස් කිරීම.

- ආගම ඉගැන්වීම සඳහා අවශ්‍ය ගුරු පුරප්පාඩු පුරවනු ඇත. පාසල්වල ආගම ඉගැන්වීම, එම විෂය සම්බන්ධයෙන් සුදුසුකම් ලත් ගුරුවරුන් විසින් සිදුකරනු ඇත.

- පුළුල් කරන ලද 'සක්වල' වැඩසටහන හරහා පාසැල්වල ඩිජිටල් ඉගෙනුම් පද්ධති වෙත ප්‍රවේශ විය හැකි බවට සහතික කරමින් සුහුරු ශ්‍රී ලංකාවක් ගොඩනැගීම ප්‍රමුඛතාගත කරනු ඇත. මෙතුළ ඩිජිටල් තාක්ෂණය භාවිතයෙන් විෂයමාලා අන්තර්ගතයන් ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදයෙහි පූර්ණ නවීකරණයන්ද ඇතුලත් වනු ඇත. ගුණාත්මක අධ්‍යාපන සේවාවන් ලබාගැනීමේ හැකියාව ඇති කරමින් මෙම වැඩසටහන කාර්මික හා වෘත්තීය ආයතන වෙතට හා විශ්වවිද්‍යාල වෙතටද ව්‍යාප්ත කෙරෙනු ඇත. සුහුරු පාසල් සහ ඩිජිටල් යටිතල පහසුකම් ස්ථාපනය කොට වැඩිදියුණු කිරීමේ කාර්යයට සහාය දක්වනු පිණිස නොමසුරු පරිත්‍යාගශීලීන් ආකර්ෂණය කරගන්නා කැපකරු පාසැල් (Foster Schools) 10,096 ක වැඩසටහනක් නිර්මාණය කෙරෙනු ඇත.

- ගෝලීය හවුල්කාරිත්වයන්, සංස්කෘතික හුවමාරු සහ පාසල් අතර සාමුහික ඉගෙනුම් අවස්ථාවන් පෝෂණය පිණිස පාසැල් බද්ධකරණ වැඩසටහනක් (Twinning Programme) ආරම්භ කෙරෙනු ඇත.

- පාසල්වල පහසුකම් පවත්වාගෙන යාම සහ නිසි කලට නඩත්තු කටයුතු සිදුවන බවට සහතික කරනු පිණිස ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ සහාය සහිත භාරකාර අරමුදලක් (Trust Fund) සෑම පාසලකම පිහිටුවීම අනිවාර්යය කිරීම.

- ගුරු පුහුණු කටයුතු කඩිනම් කිරීම මාර්ගයෙන් සියලුම අධ්‍යාපන ආයතනවල විද්‍යාව, තාක්ෂණය, ඉංග්‍රීසි, ඉංජිනේරු විද්‍යාව, සෞන්දර්යය හා ගණිතය යන විෂයයන් සඳහා මුල් තැනක් දෙන STEEAM අධ්‍යාපනයක් බිහි කිරීම පිණිස 2025 ජනවාරි මාසයේ සිට කටයුතු ආරම්භ කිරීම.

- පාසල් විෂය මාලා යාවත්කාලීන කිරීමේදී දෙස් විදෙස් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ මානව සම්පත් විශේෂඥ අදහස් ලබා ගන්නා අතර කෘත්‍රිම බුද්ධිය ඇතුළු නවීන තාක්ෂණික ප්‍රවණතාවන්ට නිසි තැන ලබා දීමට කටයුතු කෙරෙනු ඇත.

- දූ දරුවන්ට දැඩි මානසික පීඩනයක් බවට පත්ව ඇති, 5 ශ්‍රේණි ශිෂ්‍යත්ව විභාගය ඔවුන් එම පීඩනයෙන් නිදහස් වන අයුරින් සරල හා සංවිධිත කිරීම.

- වගකිවයුතු පුරවැසියන් ගොඩනැගීමෙහිලා මුල් ළමාවිය අධ්‍යාපනයේ පවත්නා මූලික වැදගත්කම හඳුනා ගනිමින් බහු-පාර්ශවකරු උපදේශක සභාවක් සහිත නියාමන අධිකාරියක් ස්ථාපනය කොට ළමුන්ට හිතකාමී හා නවීන යටිතල පහසුකම් ඇති කොට ගුරු පුහුණුව සහ ප්‍රතීතන (Accreditation) ප්‍රමිතීන් පිහිටුවාලමින් මුල් ළමාවිය සංවර්ධනය සඳහා දෙමව්පිය දායකත්වය ද ප්‍රවර්ධනය කරන්නෙමු.

- සිසුවකුට පාසල් සමයේ මුල් අදියරයන්හි සිටම ඉංග්‍රීසි භාෂාව හොඳින් තේරුම් ගැනීම, කථා කිරීම හා ලිවීම යන හැකියා ලැබෙන පරිද්දෙන් ප්‍රාථමික හා ද්විතීයික පාසල් අධ්‍යාපනය සැකසෙන අතර ඒ සඳහා නවීන තාක්ෂණික මෙවලම් භාවිතයට ගැනෙනු ඇත.

- 6-13 ශ්‍රේණිවලට අනුයුක්තව අධ්‍යාපනය ලබන සියලු පාසල් දැරියන් හට ඔසප් සනීපාරක්ෂක නිෂ්පාදන මිලදී ගැනීම සඳහා ස්වකීය කැමැත්ත පරිදි මාසික මුදල් හුවමාරුවක් ලබා ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබේ.

- විශ්වවිද්‍යාල අංශයේ වෘත්තීය ගැටලු විසඳීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වහාම ප්‍රතිව්‍යුහගත කිරීමට පියවර ගැනීම. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පනත ප්‍රතිසංස්කරණය කොට විශ්වවිද්‍යාලවල ස්වාධීනත්වය ශක්තිමත් කිරීම. රාජ්‍ය, රාජ්‍ය නොවන සහ පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම සඳහා උසස් අධ්‍යාපන කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම. සියලුම රජයේ හා රජයේ නොවන විශ්වවිද්‍යාලවල ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් වැඩිදියුණු කිරීමට අවශ්‍ය පියවර ගැනීම මගින් ඒවායේ ජාත්‍යන්තර පිළිගැනීම ඉහළ නැංවීම.

- තාක්ෂණය සහ නවෝත්පාදනයද නංවාලමින් ඉන්දියාවේ තාක්ෂණ ආයතන/ ඉන්දියාවේ කළමනාකරණ ආයතන (IIT / IIM) පන්නයේ

විශ්වවිද්‍යාලයක් මෙරට ද ස්ථාපනය කිරීමට අවශ්‍ය පහසුකම් සලසනු පිණිස ශ්‍රී ලංකාව විසින් එම ආයතන ද සමගින් සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ඇත.

- අධ්‍යයන ප්‍රමිති, පර්යේෂණ සහයෝගිතාවයන් සහ සිසු හුවමාරු වැඩසටහන් වැඩිදියුණු කිරීම ඉලක්ක කරගත් විශ්වවිද්‍යාල බද්ධකරණ (Twinning) ව්‍යාපෘති දිරිගැන්වීම.

- රාජ්‍ය නොවන සහ පෞද්ගලික විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය සඳහා දැනට පවතින රජයේ ණය වැඩසටහන පිළිගත් පෞද්ගලික වෘත්තීය පුහුණු ආයතන ද ආවරණය වන පරිදි පුළුල් කෙරෙනු ඇත.

- වෘත්තීය පුහුණු විෂය මාලා වර්තමාන වෙළෙඳපළ ඉල්ලුමට අනුකූලව විස්තීර්ණ ලෙස නවීකරණය කර ප්‍රමිතිගත කරනු ඇති අතර, එමඟින් බිහිවන උපාධිධාරීන් හා අනෙකුත් විද්‍යාර්ථීන් ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදාළ හා රැකියා ඉල්ලුමට ගැළපෙන කුසලතා පූර්ණ පිරිසක් බවට සහතික කෙරේ.

- රටේ ජීවනාලිය බඳු තරුණ ප්‍රජාව තෘප්තිමත් සහ සතුටින් සිටින පුරවැසියන් විය යුතුය. ඔවුන්ගේ ශ්‍රම දායකත්වය රටේ සංවර්ධනයට ඵලදායී ලෙස යොදා ගනනු වස් අධ්‍යාපනය, වෘත්තීය පුහුණු, ව්‍යවසායකත්වයන් සඳහා වන නවීනතම පහසුකම් සපයමින් ඔවුන්ට දේශීය හා විදේශීය නව අවස්ථාවන් කරා ළඟා වීමට පහසුකම් සපයනු ඇත.

## කාන්තාවන් සහ ළමුන් සවිබලගැන්වීම

- සෑම ග්‍රාම නිලධාරී කොට්ඨාසයක්ම ආවරණය කෙරෙන පරිදි දිවා සුරැකුම් මධ්‍යස්ථාන ආරම්භ කිරීමට රජය විසින් ව්‍යවසායකයන් දිරි ගන්වනු ඇති අතර ඒ සඳහා අවශ්‍ය මූල්‍ය දිරිගැන්වීම් ද ලබාදෙනු ඇත. සුදුසු පරිදි රජයේ සහ පුද්ගලික ආයතනයන්හිද දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවීමට සහ මෙම දිවා සුරැකුම් මධ්‍යස්ථාන නියාමනයට අවශ්‍ය සියලු සහාය ලබාදීමට ද රජය විසින් පියවර ගනු ඇත.

- සේවා බලකාය තුළ වඩා ඉහළ කාන්තා සහභාගීත්වයක් සඳහා අවශ්‍ය දිරිමත් කරවීම් සිදු කරමින් මාතෘත්ව නිවාඩු පිරිවැය රජය විසින් දරනු ඇත.

- පාර්ලිමේන්තුව, පළාත් සභා සහ පළාත් පාලන ආයතනයන්හි අවම වශයෙන් 25%ක කාන්තා නියෝජනය තහවුරු කිරීම පිණිස අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණ සිදු කරනු ඇත.

- ස්ත්‍රී-පුරුෂ සාමානාත්මතාව තහවුරු කිරීම සඳහා ද, කාන්තාවන් බලගැන්වීම සඳහා ද, ළමා ආරක්ෂාව සහ කායික හා මානසික සුභසිද්ධිය සඳහා ද වගකීම් පැවරෙන ජනාධිපති කාර්ය සාධක බලකායක් මාස 03ක් තුළ පිහිටුවනු ඇත.

- කාන්තාවන්ගේ හා ළමයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂාව උදෙසා දැනට සම්මත කර ඇති නීති පූර්ණ ලෙස බලාත්මක කිරීම අවශ්‍ය වන නිර්දේශ ලබා ගැනීම සඳහා විද්වත් කමිටුවක් පත් කරනු ලබන අතර එම නිර්දේශ වසරක කාලයක් ඇතුළත ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.

- සෑම පොලිස් ස්ථානයකම ඇති කාන්තා හා ළමා කාර්යාංශ පැය 24 පුරාම විවෘතව තබනු ඇත.

- කාන්තා මූලික පවුල් සවිබල ගැන්වීම සඳහා පරිවර්තනීය වැඩසටහනක් දියත් කරන්නෙමු. මෙමගින් කාන්තාවන් සහ ඔවුන්ගේ දරුවන් ආරක්ෂිත හා පෝෂණීය පරිසරයක සශ්‍රීකව වර්ධනය වීම සහතික කිරීම සඳහා පූර්ණ සහාය සහ ආරක්ෂාව සපයනු ඇත.

- ක්ෂුද්‍ර ණය ආයතන නියාමනය බලගැන්වෙනු ඇත. අනවසර ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර වසා දමනු ඇති අතර ඒවාට වගකිව යුත්තන් සම්බන්ධයෙන් දණ්ඩන ක්‍රියාමාර්ග කඩිනම් කෙරෙනු ඇත. ක්ෂුද්‍ර මූල්‍ය ණය උගුලේ සිරවී සිටින පුද්ගලයින් මුදා ගැනීම සඳහා සහාය වැඩසටහනක් දියත් කරන්නෙමු. මෙමගින් ඔවුන්ට මූල්‍ය ස්ථාවරත්වය යළි ලබා ගැනීමට හැකියාව ලබා දෙනු ඇත. ක්ෂුද්‍ර ණය හිමියන් විසින් පීඩනයට හා අපචාරයට ලක්වූ කාන්තාවන් ආරක්ෂා කිරීම සඳහා විශේෂ මැදිහත්වීමක් සිදුකරනු ඇත.

- සේවක අර්ථසාධක අරමුදල/ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල හරහා සනාථ කෙරෙන පරිදි 50% ඉක්මවා කාන්තාවන් සේවා නියුක්ත කෙරෙන තෝරාගත් අංශයන්හි සමාගම් වෙත බදු ප්‍රතිලාභ ලබාදෙනු ඇත.

## සෞඛ්‍යය, පෝෂණය, දේශීය වෙදකම හා සමාජ සුභසාධනය

- ජාතික පෝෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන බවට වගබලා ගන්නෙමු.

- පසුගිය වසර 25 තුළ, වයස අවුරුදු පහට අඩු දරුවන්ගේ මන්දපෝෂණය සම්බන්ධයෙන් කිසිදු වැඩිදියුණුවක් සිදු වී නැත. එය අපේ රටේ සංවර්ධනයට අහිතකර ලෙස බලපායි. දරුවන්ගේ වඩා යහපත් වර්ධනයට සහාය වීම සඳහා අත්‍යාවශ්‍ය පෝෂක සැපයීමට අපි කැපවී සිටිමු.

- ගර්භණී මාතාවන් හා කුඩා දරුවන් ආශ්‍රිත මන්ද පෝෂණ තත්ත්වය බරපතළ සෞඛ්‍ය ගැටලුවක් වශයෙන් හඳුනා ගනිමින්, ගර්භණී මාතාවන් හා

කුඩා දරුවන් සඳහා ත්‍රිපෝෂ සහ පෝෂණ මලු බෙදාහැරීමේ වැඩසටහන නැවත ආරම්භ කෙරෙනු ඇත.

- පාසල් දරුවන්ගේ ඉගෙනීමට, වර්ධනයට හා ඔවුන්ගේ ගණිත කුසලතා වැඩිදියුණු කිරීමට අවශ්‍ය පෝෂණය ලැබෙන බව සහතික කිරීම සඳහා පාසල් දරුවන් සඳහා දිවා ආහාර වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නෙමු.

- දැරිය හැකි මිලකට සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් ලබාදීම සහතික කරනු වස් ආහාර නිශ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රය සමඟ විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නෙමු.

- පුරවැසියන් තුල ක්‍රියාශීලී ජීවන රටාවන් දිරිමත් කිරීම සඳහා ශාරීරික සුවතා සහ විනෝදාස්වාද පහසුකම් වැඩිදියුණු කරන්නෙමු.

- වැඩිහිටියන් සහ නිදන්ගත රෝගවලින් පීඩා විඳින්නන් රැකබලාගැනීමටත් ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමටත් සත්කාරක පහසුකම් සපයන මධ්‍යස්ථාන වැඩිකිරීමට අවශ්‍ය මැදිහත්වීම කරනු ඇත.

- වයස අවු. 40ට වැඩි සෑම පුරවැසියෙකු සඳහාම වසර 03කට වරක් පූර්ණ වෛද්‍ය පරීක්ෂණයක් රාජ්‍ය දායකත්වයෙන් සිදු කරනු ඇත. කල් තබා රෝග හඳුනා ගැනීම මගින් ප්‍රතිකාර සඳහා රජයට වැයවන වියදම අවම කර ගැනීම සහ නිරෝගී පුරවැසි පරපුරක් බිහිකර ගැනීම මෙහි අරමුණයි.

- ශ්‍රී ලාංකිකයන් වෙත වෛද්‍ය සේවා සම්පාදනය වැඩිදියුණු කිරීමේ "හුස්ම" වැඩසටහන අපගේ රජයේ ප්‍රමුඛතම කාර්යයක් වනු ඇත. ගුණාත්මකභාවයට අදාළ ලෝක ප්‍රමිතීන් සපුරාලනු පිණිස යම් කාල සීමාවක් පුරා අරමුදල් වෙන් කිරීමේ දී සමස්ත සෞඛ්‍ය සේවා ජාලයට අදාළ පූර්ණ විගණනයක් සිදු කෙරෙනු ඇත. වැඩිදියුණු වූ සෞඛ්‍ය ප්‍රවේශ්‍යතාවයක් සහ ගුණාත්මකභාවයක් ද ප්‍රවර්ධනය කෙරෙන පරිදි රෝහල් ප්‍රජා අවශ්‍යතාවනට අනුවර්තනය කරනු පිණිස "හුස්ම" වැඩසටහනට නොකඩවා අරමුදල් සැපයීමට ත්‍යාගශීලීන් දිරිමත් කෙරෙනු ඇත.

- ඩිජිටල් හැඳුනුම්පත මගින් ද සියලු පුරවැසියන් වෙත සෞඛ්‍ය සේවා සම්පාදනය කෙරෙනු ඇත.

- නිදහස් සෞඛ්‍ය අයිතිය පුළුල් කරන අතරම "සුරක්ෂා සෞඛ්‍ය රක්ෂණය" පුළුල් කිරීම මගින් දරුවන් සඳහා ඕනෑම රෝහලකින් ප්‍රතිකාර ලබා ගැනීම සඳහා වූ අවකාශය උදා කරන්නෙමු.

- ආයුර්වේද, පාරම්පරික සිංහල වෙදකම, යූනානි, හෝමියෝපති ඇතුළු සාම්ප්‍රදායික වෛද්‍යවේදයන් ප්‍රවර්ධනය කිරීම උදෙසා රජය විශේෂයෙන් කැපවෙන අතර විකල්ප වෛද්‍ය සම්ප්‍රදායන් සඳහා විදේශීය සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා විශේෂිත වැඩපිළිවෙළක් සකස් කරනු ඇත.

- ලොව විශිෂ්ටතම ගිලන් රථ සේවයක් ලෙස පිළිගත්, මේ වන විට මහජනතාවගේ සුවිශාල ප්‍රසාදයට ලක් වී ඇති, 1990 සුව සැරිය ගිලන් රථ සේවය ප්‍රවර්ධනය කොට ආරක්ෂා කරනු ඇත. එසේම මේ සත්කාර්යය පිණිස කෘත්‍රිම බුද්ධිය (AI) ඇතුළු නව්‍ය තාක්ෂණ ආම්පන්න භාවිතය තුළින්, දිවයිනේ සෑම ප්‍රදේශයකම මහජනතාවට අදටත් වඩා හොඳ සේවාවක් සැපයීමට කටයුතු සලසනු ඇත.

## සවිබලගැන්වීම සහ සමෘද්ධිය ගොඩනැඟීම

සමාජ සාධාරණත්වය ආරක්ෂා කිරීමට සහ සමාජයේ පීඩාවට පත්වන කොටස් ආරක්ෂා කිරීමට කැප වන්නෙමු. ආත්ම විශ්වාසය සහ ආත්ම ශක්තියක් සහිත, රජය මත රඳා නොපවත්නා ජාතියක් ගොඩනැඟීම අපගේ දර්ශනයයි.

- ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සහ වකුගඩු රෝගීන් වෙත ද සෘජු මූල්‍ය සම්පාදනයන් සිදු කෙරෙනු ඇත.
    - නිදන්ගත වකුගඩු රෝගයෙන් පීඩාවට පත් පුද්ගලයින් 50,000ක් සඳහා සුභසාධන දීමනාව මසකට රු. 10,000/- දක්වා (රු. 7,500/- සිට) වැඩි කිරීම.
    - වැඩිහිටි පුරවැසියන් 820,000ක් සඳහා ලබා දෙන සුභසාධන දීමනාව මසකට රු. 5,000/- දක්වා (රු. 3,000/- සිට) වැඩි කිරීම.

- ආර්ථික වර්ධනයට දායකත්වයක් ලබා ගනු පිණිස සේවා වියුක්තිකයන් සහ ඌන සේවා නියුක්තිකයන් ද, පුහුණු කොට, ප්‍රති-කුසලතාගත කොට සේවා නියුක්ත කරවන අතරම, ව්‍යවසායකත්ව අවස්ථාවන් ද සම්පාදනය කෙරෙනු ඇත. මෙම යෝජනාක්‍රමය යටතේ, දැනට සේවා නියුක්ත උපාධිධාරීන් වෙත ඉහළම ප්‍රමුඛතාව ලබාදෙනු ඇත. රැකියා විරහිත උපාධිධාරීන් පිළිබඳ කඩිනම් තක්සේරුවක් සිදුකොට ඔවුන්ගේ පවත්නා දැනුම සහ කුසලතාවන් හඳුනා ගනිමින් අදාළ පුරප්පාඩු පවත්නා රජයේ ආයතන වෙත ඔවුන් යොමු කෙරෙනු ඇත.

- රාජ්‍ය මැදිහත්වීමෙන් සිදු කරන විදේශ රැකියා අවස්ථා ලබාදීමේදී සුදුසුකම් සහිත අඩු ආදායම්ලාභී පවුල්වල තරුණ තරුණියන්ට ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ.

## ආබාධ සහිත තැනැත්තන්

ආබාධ සහිත තැනැත්තන් යනු වෙනස්කොට සැලකිය යුතු පිරිසක් ලෙස නොව විවිධත්වයෙන් යුතු සමාජයේම

කොටසක් ලෙස හඳුනා ගනිමු. මෙම සංකල්පීය රාමුව ඇතුළත ශ්‍රී ලංකාවේ සංවර්ධනය සහ සමාජ ව්‍යුහය ඇතුළත ආබාධ සහිත පුරවැසියන්ගේ ස්වායත්ථතාව සහ සහභාගිත්වය සහතික කරන්නෙමු.

- ආබාධ සහිත පුද්ගලයින් සඳහා සහන ප්‍රතිලාභ දිගටම ලබා දෙන අතර 410,000ක් වන ප්‍රතිලාභීන් සඳහා සුභසාධන දීමනාව මසකට රු. 10,000/- දක්වා (රු. 7,500/- සිට) වැඩි කිරීම.
- ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ ඇති මූල ධර්මයන්ට අනුකූල වන පරිදි දේශීය නීති රාමුව සකස් කිරීම.
- අධ්‍යාපනය, සේවා සහ රැකියා, සෞඛ්‍යය, දුගීබව තුරන් කිරීම සහ සමාජ ආරක්ෂණය, නිවාස, ප්‍රවාහන, ක්‍රීඩා, අධිකරණ, මහජන සහභාගිත්ව සහ සමාජ, ආගමික, සංස්කෘතික සහ සෙසු හිමිකම්වලට අදාළ සියලු භාණ්ඩ හා සේවාවන් වෙත ආබාධිත ප්‍රජාවගේ ප්‍රවේශ්‍යතාව තහවුරු කරනු ඇත.
- ආබාධිත තැනැත්තන්ගේ හිමිකම් ප්‍රවර්ධනය සඳහා වූ ජාතික වැඩසටහන කාර්යක්ෂමව සහ ඵලදායීව කළමනාකරණය කරනු පිණිස ජාතික දත්ත පද්ධතියක් පිහිටුවනු ඇත.
- ආබාධ සහිත පුද්ගලයින් සඳහා රාජ්‍ය සේවයේ රැකියා අවස්ථාවලින් 3%ක කෝටාවක් ලබා දීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ලැබේ.
- ආබාධිත තැනැත්තන්ගේ හිමිකම් සියලු පුරවැසියන්ගේ හිමිකම් හා සමාන්තරව පවත්නා බවට වගබලාගනු පිණිස ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට ද, අධීක්ෂණය පිණිස ද ආබාධිත හිමිකම් කොමිෂන් සභාවක් පිහිටුවන්නෙමු.

## ආදිවාසි ජන ප්‍රජාව

කිසිදු වෙන්කොට සැළකීමකින් තොරව සියලු හිමිකම් සහ වරප්‍රසාද විෂයයෙහි හිමිකම් ලබා දෙමින්, ආදිවාසි ජන ප්‍රජාවන් වෙත ගෞරවාන්විතව සැළකිය යුත්තේය යන්න සමගි ජන බලවේගයේ /සමගි ජන සන්ධානයේ දැඩි විශ්වාසයයි. වන භූමි ප්‍රමාණය අඩු වෙමින් පැවතීම සහ ජල හිඟතාව හේතුකොට ඔවුන් විසින් මුහුණ පා ඇති දුෂ්කරතාවනට මුහුණ දිය හැකි පරිදි තිරසර විසඳුම් ලබා දීම සමගි ජන බලවේග අනාගත රජයක ප්‍රමුඛ කටයුත්තක් වනු ඇත. දේශීය ආදිවාසි ජන ප්‍රජාව මුහුණ පා ඇති බරපතළ ගැටලුවක් වන ක්ෂුද්‍ර මූල්‍ය ණය අර්බුදය සඳහා විසඳුම් ලබාදෙනු ඇත.

තවද, ආදිවාසි ජන ප්‍රජාවන්ගේ ආගමික, සංස්කෘතික, සමාජමය සහ ආර්ථික අයිතිවාසිකම් ද ආරක්ෂා කරනු ලබන බවට වගබලා ගන්නෙමු.

## ක්‍රීඩා

- යල්පැන ගිය 1973 අංක 25 දරණ ක්‍රීඩා පනත ඉවත් කොට වර්තමාන අවශ්‍යතාවලට ගැළපෙන නව ක්‍රීඩා පනතක් වසරක් තුළ හඳුන්වා දෙනු ලැබේ.
- දේශීය ක්‍රීඩා තරඟ කාලසටහන නිශ්චිත කිරීමට කටයුතු කරන අතර දේශීය ක්‍රීඩාවන්හි ප්‍රමිතිය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය කරන යටිතල පහසුකම් සහ පුහුණුකරුවන් සැපයීම වෙනුවෙන් ප්‍රමුඛතාව ලබා දෙනු ඇත.
- ජාත්‍යන්තර තරගාවලිවලදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීමට සුදුසුකම් ලබන ක්‍රීඩකයන් උදෙසා අවශ්‍ය අරමුදල් ලබා ගැනීම සඳහා විශේෂිත අරමුදලක් රජයේ සහ පෞද්ගලික අංශයේ දායකත්වයෙන් පිහිටුවනු ඇත.
- "ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය" පාර්ලිමේන්තු පනතකින් ස්ථාපනය කොට ක්‍රිකට් ක්‍රීඩාවේ දූෂණය ඉවත් කිරීම සඳහාත්, ක්‍රිකට් ක්‍රීඩාව ප්‍රවර්ධනය සඳහාත් අවශ්‍ය නීතිමය පරිසරය සකසා දෙනු ඇත.



# රාජ්‍ය සේවය නංවාලීම

“ඩිජිටල් පොදු යටිතල පහසුකම් හරහා රාජ්‍ය සේවා සැපයීම නවීකරණය කිරීමට අරමුණු කරන අතරම, කාර්යක්ෂමතාව, විනිවිදභාවය සහ ප්‍රවේශ්‍යතාව සහතික කරමින් සියලු ශ්‍රී ලාංකිකයන්ට සේවය කිරීම සඳහා කුසලතාවයෙන් සහ වගවීමෙන් යුත් රාජ්‍ය සේවයක් බිහි කිරීමට කටයුතු කරමු.”



## විසි එක්වන සියවස සඳහා ඩිජිටල් ශ්‍රී ලංකාවක්

සමගි ජන බලවේගයේ අනාගත රජයක් යටතේ මහජන සේවා සම්පාදනය වැඩිදියුණු කිරීම, සංවර්ධන අභිමතාර්ථ වේගවත් කිරීම සහ යහ පාලනය සහතික කිරීම උදෙසා ඩිජිටල් පොදු යටිතල පහසුකම් (DPI) නිර්මාණය කෙරෙනු ඇත.

- ඩිජිටල් පොදු යටිතල පහසුකම් (DPI) මූලාරම්භය යටතේ සියලු ශ්‍රී ලාංකික පුරවැසියන් හට නිශ්චිත හඳුනා ගැනීමේ අංකයක් ලබාදෙනු ඇත. මෙමගින් උප්පැන්න, විවාහ සහ මරණ සහතික, විදේශ ගමන් බලපත් සහ වැදගත් ලේඛනයන්හි සහතික කළ පිටපත් ලබාගැනීම ආදී වශයෙන් මේවන විට වෙහෙසකර මට්ටමේ පවත්නා සේවාවන් හුදෙක් බොත්තමක් එබීමෙන් ලබාගැනීමේ හැකියාව උදා කිරීම හරහා ඔවුන් වෙත ලබා දෙන සේවාවන්හි කාර්යක්ෂමතාව සහතික කෙරෙනු ඇත.

- රජය සහ පුරවැසියා අතර හා රජයේ ආයතන, බැංකු සහ පිළිගත් මූල්‍ය ආයතන අතර ද, දත්ත අන්තර් මෙහෙයුම්කරණ හැකියාව ලබාදෙන්නාවූ ඩිජිටල් පොදු යටිතල පහසුකම් වසර 02ක් ඇතුළත ක්‍රියාත්මක මට්ටමට ගෙන එනු ඇත. ශ්‍රී ලංකාව මුදල් රහිත ගනුදෙනු කෙරෙහි නැඹුරු වූ නවීන සමාජයක් බවට පරිවර්තනය කරමින් ඩිජිටල් මූල්‍ය ගනුදෙනු නංවාලීමේ ක්‍රමයක් ස්ථාපනය කෙරෙනු ඇත.

- සමස්ත ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන පද්ධතිය ආවරණය වන පරිදි ලංකා රාජ්‍ය ජාලය සහ ලංකා රාජ්‍ය මේඝය (Lanka Government Cloud) ව්‍යාප්ත කරමින් සියලු රජයේ ආයතනයන් වෙත ප්‍රශස්ත සේවා සම්පාදනයක් ලබාදිය හැකිවන සේ එය තාක්ෂණිකව බලගැන්වීම සිදු කරනු ඇත.

- මාස 03ක් තුළ ශ්‍රී ලංකාවට අංග සම්පූර්ණ සයිබර් ආරක්ෂණ නීතියක් හඳුන්වාදෙනු ඇත.

- 2022 අංක 09 දරණ පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන රෙගුලාසි පැනවීම සහ ඊට අවශ්‍ය පහසුකම් සැපයීම.

- නව ආරම්භක ව්‍යාපාර දියුණු කිරීම සඳහා පෞද්ගලික අංශයේ ද දායකත්වය ඇතිව, සංවර්ධන අරමුදලක් ඇති කිරීම.

- ශ්‍රී ලංකාව තුළ තොරතුරු තාක්ෂණ ව්‍යාපාරවල සංවර්ධනයට සහ කාර්යක්ෂම පුරවැසි සේවා සැපයීමට බාධාවක් වී ඇති අධිවේගී අන්තර්ජාල පහසුකම් (High-speed Internet facilities) නොලැබීමේ ගැටලුව විසඳීම අප රජයේ ප්‍රමුඛ කර්තව්‍යයක් ලෙස සළකනු ඇත.

- තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ව්‍යාපාර මත පනවා ඇති අසාධාරණ බදු ඉවත් කොට එම ක්ෂේත්‍රය රටේ සංවර්ධනය උදෙසා දක්වන සුවිශේෂී දායකත්වය පිළිගනිමින්, එම ක්ෂේත්‍රයට අදාළව, සාධාරණ සහ ආකර්ෂණීය බදු ප්‍රතිපත්තියක් අලුතින් හඳුන්වා දීම.

- තොරතුරු තාක්ෂණ ව්‍යාපාර සඳහා ශ්‍රී ලංකාවට ආනයනය කෙරෙන ඉලෙක්ට්‍රොනික උපකරණ මත බදු අවම කිරීම.

## සැලසුම් සහ සැලසුම් ක්‍රියාත්මක කිරීම

- ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ සහ ප්‍රතිපත්ති සැලසුම් ක්‍රියාත්මක කිරීමේ කැබිනට් අමාත්‍යාංශයක් නැවත පිහිටුවනු ඇත. එම අමාත්‍යාංශය මගින් ප්‍රතිපත්ති සම්පාදනය, ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කරනු ඇත.

- මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සනාථ කිරීම සඳහා පූර්ණ බලැති විද්වත් වෘත්තිකයින්ගෙන් සමන්විත "ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ කොමිෂන් සභාවක්" ස්ථාපනය කරන්නෙමු. මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ඉලක්ක නියම කිරීම ද, ප්‍රගතිය සමාලෝචනය ද, පසුබෑම් අධ්‍යයනය කොට පිළියම් යෙදීම ද, මෙම කොමිෂන් සභාවේ කාර්යභාරය වනු ඇත. මැතිවරණ පොරොන්දු ක්‍රියාත්මක කිරීමේ වාර්ෂික ප්‍රගතිය දැක්වෙන වාර්තාවක් එම කොමිෂන් සභාව මගින් ප්‍රසිද්ධ කරනු ඇත.

## රාජ්‍ය සේවය

- සමස්ත රාජ්‍ය සේවයම ආවරණය වන පරිදි පූර්ණ මානව සම්පත් විගණනයක් සිදු කොට සමස්ත රාජ්‍ය සේවයම මානව සම්පත් කළමනාකරණ සැලැස්මකට අනුව ප්‍රතිසංවිධානය කිරීම. රාජ්‍ය සේවයේ සියලුම බඳවා ගැනීම්, පත්කිරීම් සහ අනුයුක්තකිරීම් කුසලතා මත පදනම්ව සිදු කරනු ලබන අතර, දක්ෂතාවයන් සහ සුදුසුකම් මත පුද්ගලයින් උපායමාර්ගිකව ස්ථානගත කිරීම සහතික කෙරේ.

- මහජන සේවය ඉටු කිරීම ප්‍රමිතිකරණය කොට කාර්ය සාධන ඇගයුම් ඉලක්ක මත පදනම්ව රාජ්‍ය සේවය අඛණ්ඩව ඇගයීම සිදු කරයි. ප්‍රමිතිගත ජාතික හා ජාත්‍යන්තර පුහුණු අවස්ථා රාජ්‍ය සේවයට ලබාදීමට කටයුතු කරන්නෙමු. ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතු සිවිල් සේවා විද්‍යා පීඨයක් ස්ථාපනය කරමින් සිවිල් සේවය සඳහා වන පුහුණු ඉහළ ප්‍රමිතිගතකරණයකට ලක් කරන්නෙමු.

- රජයේ සේවකයන්ගේ ජීවන වියදම් දීමනාව ඉහළ නැංවීම: අපගේ රජය විසින් රාජ්‍ය අංශ සේවකයන් හට ලබාදෙන මාසික ජීවන වියදම් දීමනාව දැනට ලබාදෙන රු. 17,800 සීමාවේ සිට රු. 25,000ක අවමයක් දක්වා ඉහළ නංවනු ඇති අතර, එය වත්මන් දීමනාවනට ද ගළපනු ඇත.

- රජයේ සේවකයන්ගේ මූලික වැටුප ඉහළ නැංවීම:රාජ්‍ය සේවය සඳහා අදාළවන අවම මූලික මාසික වැටුප (දැනට ශ්‍රේණි සඳහා අදාළ අනුපාතයන් මත පදනම්ව) 24%කින් ඉහළ නැංවෙනු ඇත. මෙම ගැළපුමට මේවන විට ලබාදෙන විවිධ ගැළපීම් සහ දීමනාවනට අදාළ යම් නියමයන් හා කොන්දේසි ද ඇතුළත් වනු ඇත.
උක්ත ගැලපීම් දෙක ද එක්වූ විට ජීවන වියදම් දීමනාව ද ඇතුළත් රාජ්‍ය සේවයේ අවම දළ වැටුප රු. 57,500ක් වනු ඇත.

- 2016 අයවැය යෝජනා මගින් නවක රාජ්‍ය සේවකයින්ගේ විශ්‍රාම වැටුප් හිමිකම් සම්බන්ධයෙන් ඇති කර ඇති අඛණ්ඩ අවිනිශ්චිතතාව සැළකිල්ලට ගනිමින්, අපි පෙර තීරණය අවලංගු කර 2016 සිට බඳවා ගත් සියලුම රජයේ සේවකයින්ට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය අනුව ඔවුන්ගේ විශ්‍රාම වැටුප් ලබා දීමට යෝජනා කරමු. ඒ අනුව ඔවුන්ගේ පත්වීම් වෙනස් කරනු ඇත

- රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරීන් ඔවුන්ගේ සුදුසුකම්, හැකියාවන් සහ කැමැත්ත මත පදනම්ව රාජ්‍ය සේවය ඇතුළත යෝග්‍ය තනතුරුවලට නැවත යොමු කෙරෙනු ඇත. දැනට සංවර්ධන නිලධාරීන් ලෙස සේවය කරන නිලධාරීන්ට රැකියා වෙළෙඳපළ තුළ තරඟකාරීව රැකියා අවස්ථා සොයා ගැනීමට හැකියාව ලැබෙන පරිදි සුදුසු වෘත්තීය පුහුණුවීම් ලබා ගැනීමට රජයේ අනුග්‍රහය ලබා දෙනු ඇත.

## පාස්පෝට් පෝළිම අවසන්

- පෝළිම් නොමැතිව කඩිනමින් විදේශ ගමන් බලපත්‍ර සහ හැඳුනුම්පත් ලබාදීම සඳහා සෑම පරිපාලන දිස්ත්‍රික්කයකම ආගමන විගමන දෙපාර්තමේන්තුව සහ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව ඒකාබද්ධව පවත්වා ගෙන යන සේවා මධ්‍යස්ථාන 25 ක් ස්ථාපනය කරනු ඇත.

- උප්පැන්න, මරණ හා විවාහ සහතික සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින්ම ලබා ගැනීම තහවුරු කිරීමට සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ලංකා රාජ්‍ය ජාලය (Lanka Government Network) හා සම්බන්ධ කෙරෙනු ඇත.



# ජීවන තත්ත්වය ආරක්ෂා කිරීම

"ජන සවිය", "සමෘද්ධි", "අස්වැසුම", "ගැමිදිරිය" යන සමාජ ආරක්ෂණ වැඩසටහන්වල යහභාවිතයන් උකහා ගනිමින්, පුළුල් නව වැඩපිළිවෙලක් සකස් කරමින් දිළිඳුකම ඉතිහාසයේ කොටසක් බවට පත් කරනු ඇත.

## ආගමික හා සංස්කෘතික කටයුතු

- කරුණාව, මෛත්‍රීය, උපේක්ෂාව හා මුදිතා බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමමින් බුද්ධශාසනය පෝෂණය කොට සුරක්ෂිත කරන අතර අනෙකුත් ආගම් අදහන තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටත්, කැමති ආගමක් ඇදහීමේ හා වන්දනාමාන කිරීමේ ඇති මූලික අයිතිය තහවුරු කිරීමටත් කටයුතු කරන්නෙමු.

- දහම් පාසල්, පිරිවෙන් හා ආගමික අධ්‍යාපනය ශක්තිමත් කිරීම සඳහා පූර්ණ රාජ්‍ය අනුග්‍රහය ලබා දෙනු ඇත.

- අන්තර් ආගමික අධ්‍යාපනය පාසල් විෂය මාලාව තුළට ඇතුළත් කොට තමන් අදහන ආගමට අමතර අනෙක් ආගම් පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් ළමා පරපුරට ලබාදීම සඳහා පියවර ගනු ඇත.

- කෘත්‍රිම බුද්ධිය (AI) මානුෂවාදීව සහ සදාචාරාත්මකව වැඩි දියුණු කිරීමෙහිලා බෞද්ධ දර්ශනයෙන් හා අනෙකුත් ආගමික දර්ශනයන්ගෙන් ලබා ගත හැකි ආදර්ශ සම්බන්ධ පර්යේෂණ පිණිස රාජ්‍ය අනුග්‍රහය ලබාදෙනු ඇත.

- කලා නිර්මාණයන් සඳහා පවත්නා සියලු වාරණයන් ඉවත් කරන්නෙමු. ඒ වෙනුවට නිර්මාණ වර්ගීකරණයට හා ඇගයීමට නිශ්චිත යාන්ත්‍රණයක් ස්ථාපිත කරන්නෙමු.

- පාරම්පරික කලාකරුවන්ට වෘත්තීය ජීවිතය උසස් තත්ත්වයකට පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය රාජ්‍ය අනුග්‍රහය ලබා දෙන්නෙමු.

- කලා නිර්මාණ සඳහා වන බුද්ධිමය දේපල ගැටලු විසඳීම සඳහා විශේෂ ඒකකයක් බුද්ධිමය දේපල කාර්යාංශය තුළ පිහිටුවීම සිදු කරන්නෙමු.

- ඩිජිටල් පොකුරු සිනමා ශාලා ප්‍රවර්ධනය කරමින් ලාංකීක ප්‍රේක්ෂකයා සිනමා ශාලා වෙත ආකර්ෂණය කර ගැනීමට කටයුතු කරන්නෙමු.

- චිත්‍ර, මූර්ති, ඡායාරූප, සංගීත නාට්‍ය ඇතුළු සංස්කෘතික හා කලා කටයුතු සඳහා වන පුහුණු හා ප්‍රදර්ශන සංවිධානය කිරීම සඳහා වන නිදහස් කලා අවකාශ සෑම දිස්ත්‍රික්කයකම ස්ථාපිත කරන්නෙමු.

## මාධ්‍ය

- 2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනතේ ඇති ප්‍රකාශනයේ නිදහසට එරෙහි වගන්ති ඉවත් කරන්නාවූ ද, අන්තර්ජාල සේවා සපයන ආයතනවලට ස්වකීය ව්‍යවසායන් බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීමට ඉඩසලසන්නා වූ ද, පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම නව රජයේ ප්‍රමුඛ කාර්යයක් වේ.

- මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික මාධ්‍ය ක්ෂේත්‍රයන්හි සියලුම පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සැළකිල්ලට ගනිමින් ජනමාධ්‍ය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය තීන්දු සහ නියාමනයට අදාළ වගකීම් පැවරෙන ස්වාධීන ජාතික මාධ්‍ය කොමිෂන් සභාවක් ඇති කරනු ඇත.

- ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන් ද ඇතුළත් මාධ්‍ය ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ගේ රැකියා ස්ථාවරභාවය සුරැකීම සඳහා අවශ්‍ය වන්නා වූ නීතිමය රැකවරණය ලබාදෙන නව නීති සහ රෙගුලාසි පැනවීම සිදු කරනු ඇත.

- බ්‍රිතාන්‍යයේ බී. බී. සී. මාධ්‍ය ජාලයේ පවත්නා පරිපාලන මාදිලිය අනුගමනය කරමින් සෘජුවම පාර්ලිමේන්තුවට වගවන්නා වූ "භාරයක්" යටතේ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සහ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව පාලනය කෙරෙනු ඇත.

## නිවාස හා පොදු පහසුකම්

- අඩු ආදායම්ලාභී සහ මධ්‍යම පාන්තික නිවාස යෝජනාක්‍රම ඉදිකිරීම සඳහා රජය සතු ඉඩම් ලබාදෙනු ඇත.

- රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ අසම්පූර්ණ නිවාස යෝජනා ක්‍රම කඩිනමින් අවසන් කරනු ඇත. සියලු දෙනා සඳහා සාධාරණ ජීවන තත්ත්වයන් සහතික කරනු වස් අලුතින් ගොඩනගනු ලබන විවිධාංගීකරණය වූ නිවාස යෝජනාක්‍රමය තුළ ග්‍රාමීය, නාගරික, කඳුරට, ආපදාවන්ගෙන් බලපෑමට ලක්වූ පළාත් සහ ධීවර ප්‍රජාවන් ප්‍රමුඛතාගත කෙරෙනු ඇත.

- නිවාස සහ වාණිජ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අවශ්‍යවන අමුද්‍රව්‍ය ආනයනය කිරීමේදී දැනට පනවා ඇති අධික බදු ඉවත් කර ඉදිකිරීම් වියදම අඩු කර ගැනීම සඳහා පියවර ගනු ඇත.

- සිය පළමු නිවාස ඒකකය මිලදී ගනු ලබන හෝ නිවාස ඉදිකිරීම සඳහා පළමු ඉඩම් කට්ටිය මිලදී ගනු ලබන කුටුම්භයන් සඳහා අවම පොළියට දිගු කාලීන ගෙවුම් විකල්ප මත විශේෂ නිවාස ණය යෝජනා ක්‍රමයක් (දෙ-පරපුරු ණය - Two Generation Loan) හඳුන්වා දෙනු ඇත.

- විදුලි බලය, ඛනිජ තෙල්, ගෑස් සහ ජලය ද ඇතුළත් සියලු උපයෝගිතාවන් ආශ්‍රිත නියාමනයන් සහතික කරනු පිණිස ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) බලගැන්වෙනු ඇත.

## විදෙස්ගත ශ්‍රමිකයන් සහ සේවා නියුක්තිය

- ශ්‍රී ලංකාවට සුවිශේෂී ඩිජිටල් අනන්‍යතා ක්‍රමය ක්‍රියාත්මක වීමෙන් අනතුරුව විදෙස්ගත සේවා නියුක්තිකයන් සඳහා වූ නිවාස ඉදිකිරීම් ද්‍රව්‍ය සම්බන්ධයෙන් බදු නිදහස් වැඩසටහනක් රජය විසින් ක්‍රියාත්මක කරනු ඇත. විදේශ ප්‍රේෂණ මත පදනම්ව විදුලි වාහන සඳහා වාහන බලපත්‍ර නිකුත් කිරීමට නව ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ඇත.

- විදේශ රැකියා නියුක්ති කාර්යාංශය වඩාත් කාර්යක්ෂම සහ ඵලදායී අයතනයක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය වන නීතිමය හා පරිපාලන ප්‍රතිසංස්කරණ සිදු කරනු ඇත.

- විදේශගත ශ්‍රමිකයින්ට විදේශයන්හි සිට ඡන්දය ප්‍රකාශ කිරීමට හැකි වන පරිදි මැතිවරණ නීතිය සංශෝධනය කරනු ලැබේ.

- මැද පෙරදිග සහ වෙනත් රටවල සිරගත වී සිටින හෝ ශ්‍රී ලංකාවට පැමිණීමට නොහැකි දුෂ්කර තත්ත්වයන්වලට මුහුණ දී සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් මෙරටට ගෙන්වා ගැනීම සඳහා කඩිනමින් කටයුතු කරනු ඇත.

- පෞද්ගලික අංශයේ සියළු සේවා නියුක්තිකයන්ට දායකත්ව රක්ෂණාවරණ ක්‍රමයක් සහ විශේෂ නිවාස වැඩසටහනක් ක්‍රියාවට නංවනු ඇත.

- ගෘහ සේවය නියාමනය කිරීම සඳහා නීති පැනවීම, රැකියා ස්ථානයේ හිරිහැර කිරීම් වැළැක්වීම, අදාළ ජාත්‍යන්තර කම්කරු සංවිධානමය සම්මුතීන් අනුමත කිරීම සහ කම්කරුවන් ආරක්ෂා කිරීම සඳහා කම්කරු නිලධාරීන්ගේ අධීක්ෂණය වර්ධනය කිරීමට පියවර ගනු ලැබේ.

- කෙටිකාලීන රැකියා සහිත නිදහස් වෙළෙඳපළ ක්‍රමයේ (Gig economy) ස්වයං රැකියාගත වූවන් සහ ගෘහ සේවකයන්ගේ හිමිකම් සහ ආරක්ෂක ජාල බලගැන්වෙනු ඇත. නව නීති හඳුන්වා දෙමින් දායකත්ව ඉතුරුම් යෝජනාක්‍රමයක් ද හඳුන්වා දෙන්නෙමු.

## "මලෙයි ජන ප්‍රජාව"

සියවස් දෙකක් පුරා මලෙයි ජන ප්‍රජාව විසින් ශ්‍රී ලංකාවට ලබාදී ඇති අතිමහත් දායකත්වය පිළිගන්නෙමු. ඔවුන් විසින් අත්විඳින ලද ව්‍යුහාත්මක බැහැරකරණය සැළකිල්ලට ගත් කල එම පිරිස්වල යහසාධනය වැඩිදියුණු කරනු වස් ධනාත්මක ක්‍රියාමාර්ග ගත යුතු බැව් වටහාගෙන සිටිමු. ඒ උදෙසා පහත සඳහන් ක්‍රියාමාර්ග ඔස්සේ ක්‍රියාත්මක වන්නෙමු:

- විද්‍යාව, ගණිතය සහ තාක්ෂණවේදය යන විෂය ධාරාවන් සහිත ජාතික පාසල් ස්ථාපනය ද ඇතුළත්ව ඉලක්කගත වැඩසටහන් හරහා සියලු මට්ටම්හි කඳුරට වතු සිසුන්ගේ අධ්‍යාපනික සාර්ථකත්වයන් ඉහළ නංවාලීම සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.

- විද්‍යාව, තාක්ෂණවේදය, ඉංග්‍රීසි, ඉංජිනේරු විද්‍යාව, කලා සහ ගණිතය (STEEAM) යන විෂයයනට අදාළව ගුරුවරුන් පුහුණු කරනු වස් දෙමළ මාධ්‍යයෙන් අතිරේක අධ්‍යාපන විද්‍යා පීඨයක් සහ හෙද පුහුණු ආයතනයක් ස්ථාපනය කිරීම.

- ශ්‍රී ලංකා කඳුකර විශ්වවිද්‍යාලය (HUSL) යන යෝජිත නම සහිතව පරිපූර්ණ විශ්වවිද්‍යාලයක් ස්ථාපනය කිරීමේ පළමු පියවරක් වශයෙන් දැනට පවත්නා විශ්වවිද්‍යාලයකට අනුබද්ධව හැටන් ප්‍රදේශයේ මණ්ඩපයක් ආරම්භ කිරීම.

- කඳුරට වතුකර තරුණ තරුණියන් හට ඉලක්කගත සහ ප්‍රවේශ වීමේ හැකියාව සහිත වෘත්තීය පුහුණු වැඩසටහන් සම්පාදනය කිරීම.

- වතු අංශයේ සියලු සෞඛ්‍ය පහසුකම් ජාතික සෞඛ්‍ය පද්ධතීන් හා ඒකාබද්ධ කිරීම.

- ළමුන් අතර මිටි වීමේ ප්‍රවණතාව, ප්‍රජනන වයස් සීමාවන්හි කාන්තාවන් අතර රක්තහීනතාවය, ළදරු සහ මාතෘ මරණ පිළිබඳ ගැටලු විසඳීම කරනු පිණිස ඉලක්කගත සහාය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

- වතු ජන ප්‍රජාවන්ගේ සමාජ ආරක්ෂණ වැඩසටහන සාධාරණ හා යුක්ති සහගත ලෙස ක්‍රියාත්මක කරන බවට වගබලා ගැනීම.

- වතු කම්කරුවන්, ඉඩම් හිමි කුඩා වතු හිමි ගොවීන් බවට පරිවර්තනය කිරීමේ රජයේ ප්‍රතිපත්තියක් හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම.

- මෙම සංක්‍රමණීය කාල පරිච්ඡේදය තුළ වතු කම්කරුවන් හට ජීවත්වීමට සරිලන වැටුපක් සහතික කිරීම.

- වගා කටයුතු, සත්ත්ව පාලනය සහ ව්‍යවසායකත්ව කටයුතු ආදී ජීවනෝපාය අවශ්‍යතාවන් සඳහා වතුවලට අයත් අත්හැර දමන ලද ඉඩම් වතු ආශ්‍රිත පදිංචිකරුවන් අතර බෙදා දීම. වතුකරයේ පදිංචිකරුවන් විසින් දැනටමත් වගා කටයුතු සිදු කරමින් පවත්නා ඉඩම්වලට රජයේ ප්‍රතිපත්තිය ප්‍රකාර ඔප්පු ලබාදීම.

- මලෙයි ප්‍රජාවන් ප්‍රමාණවත් ලෙස ආවරණය නොවන  ප්‍රදේශයන්හි රාජ්‍ය සේවයේ සේවා නියුක්තිය සඳහා ජනාධිපති රණසිංහ ප්‍රේමදාසයන්ගේ ප්‍රතිපත්තිය හා සමාන්තරව ධනාත්මක ක්‍රියාකාරී වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. ඒ අනුව වතුකර ප්‍රදේශයන්හි නව ගම්මාන ස්ථාපනය සහ NEVIDA වෙත එහි විධි නියමය සපුරාලීමට හැකිවනු පිණිස ප්‍රමාණවත් සම්පත් ලබාදීම. නව ග්‍රාම නිලධාරි සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සීමා නිර්ණය කොට වතු සේවකයන් වතු හිමියන් වෙත බැඳී පවත්නා මට්ටමේ සිට පරිපූර්ණ පුරවැසියන් බවට පරිවර්තනය වීමේ හැකියාව ලබාදෙන විමධ්‍යගත රාජ්‍ය සේවාවන් වෙත සම ප්‍රවේශ අවස්ථා ලබාදෙනු ලබන බවට වගබලා ගැනීම.

- වතු ආශ්‍රිතව පදිංචි පවුල්වලට නිවාස තැනීම සඳහා හිමිකම් ඔප්පු සහිත ඉඩම් ලබාදෙනු ලබන බවට සහතික කිරීමේ නීතිමය හා පරිපාලනමය ක්‍රියාමාර්ග ගැනීම. එම ඉඩම්, මාර්ග වෙත පහසු ප්‍රවේශයන් සහිත ස්ථානයන්හි ස්ථානගතව පවතිනු ඇත. බෙදාදෙනු ලබන ඉඩමේ වපසරිය එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සෙසු පිරිස් වෙත ලබාදෙන ලද ඉඩම් වපසරියට සමාන වනු ඇත.

- වැවිලි මානව සංවර්ධන භාරය (PHDT), ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (NHDA) හා සෙසු රජයේ වැඩසටහන් යටතේ දැනටමත් ගොඩනගා ඇති නිවාසවලට හිමිකම් ඔප්පු ලබාදීමෙන් ඒවා නියමානුකූල කිරීම.

- නාගරික කේන්ද්‍ර තුළට සංක්‍රමණය වන දෙමළ ජනතාව අඩු ආදායම් නිවාස වැඩසටහන් ද ඇතුළත් සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් තුළට ඒකාබද්ධ කිරීම සහ මෙම පවුල්වල දරුවන්ට ඉඩකඩ සැලසෙන පරිදි ප්‍රදේශයේ පාසැල්වල සම්පත් වැඩිදියුණු කිරීම.

- කාර්යක්ෂම හා තාර්කික බලය බෙදාහැරීම සහතික කරනුවස් වතුකර ප්‍රදේශයන්හි පළාත් පාලන ආයතන සංඛ්‍යාවන් සමාලෝචනය කරන්නෙමු.

- කඳුරට වතු ජනතාවගේ විසිර පැතිර පවත්නා රටාව සැලකිල්ලට ගනිමින් සංවර්ධන වැඩසටහන්වල නිරත වීම සඳහා අවශ්‍ය උපදේශාත්මක සහ විධායක බලතල සහිතව, කඳුරට වතු දෙමළ ජන ප්‍රජාවන්ගේ සංස්කෘතික, සමාජ, ආර්ථික සහ දේශපාලන ජීවිත වෙත යම් බලපෑමක් සහිත පනත් කෙටුම්පත් සහ නීති අධීක්ෂණය කොට විමසා බැලීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් තුළ රජයේ ආයතනයක් වශයෙන් භෞමික සීමාවට යටත් නොවන ප්‍රජා සභාවන් (Non-Territorial Community Councils) නිර්මාණය කිරීම.

## විශ්‍රාමික ප්‍රතිලාභ සුරැකීම

- වසර 2016 - 2019 කාලය තුළ විශ්‍රාමිකයන්ට අහිමි වූ විශ්‍රාම වැටුප් සංශෝධන ලබා දීම හා විශ්‍රාම වැටුප් විෂමතාවට තිරසර විසඳුමක් ලබා දීම.

- 2016ට පෙර විශ්‍රාම ලබා සිටින විශ්‍රාමිකයන් වෙනුවෙන් ද අග්‍රහාර රක්ෂණාවරණ රැකවරණය පුළුල් කිරීම.

- විශ්‍රාමික ප්‍රජාව වෙත වඩා ඉහළ ප්‍රතිලාභ සලසන අයුරින් රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදලේ කළමනාකරණය ශක්තිමත් කරනු පිණිස 1999 අංක 40 දරන රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල පනත සංශෝධනය කරන්නෙමු.

## රණවිරු සුභසාධනය

- ජාතික ආරක්ෂාව උදෙසා සිය ජීවිත පූජා කළ රණවිරුවන්ගේ ආත්මාභිමානය ආරක්ෂා කරමින් ඔවුන්ගේ සුභසාධනය සහතික කරනු පිණිස රණවිරු කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවක් මාස 6ක් ඇතුළත ස්ථාපනය කෙරෙනු ඇත. රණවිරු සුභ සාධනය සඳහා වර්තමානයේ වගකීමෙන් බැඳී සිටින දැනට පවත්නා සියලු ආයතන මෙම දෙපාර්තමේන්තුව යටතේ ඒකාබද්ධ කෙරෙනු ඇත. මෙමගින් පුනරුත්ථාපනය, සෞඛ්‍ය, වෘත්තීය අධ්‍යාපනය, උපදේශනය සහ නිවාස ගැටලු නිරාකරණය යන සේවාවන් සම්පාදනය කෙරෙනු ඇත.

- විශ්‍රාමික රණවිරුවන්ට අදාළව 'එක නිලයක් - එක විශ්‍රාම වැටුපක් - One Rank-One Pension' ප්‍රතිපත්තිය පිළිගැනීම.

- රණවිරුවන්ගේ ගැටලුවලට සවන් දී ඒවා විසඳීම සඳහා විශේෂිත ඔම්බුඩ්ස්මන්වරයෙක් පත් කර එයින් ලැබෙන නිර්දේශ මාස 06ක් ඇතුළත ක්‍රියාත්මක කිරීම.

## ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාලයක් ගොඩනැගීම

- දිගුකාලීන තිරසරභාවය සඳහා, ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් ක්‍රමය සම්පූර්ණයෙන්ම ප්‍රතිසංවිධානය කළ යුතු බවට යෝජනා කරමු. මෙයට රාජ්‍ය සේවකයින්, පුද්ගලික අංශයේ සේවකයින් සහ සංක්‍රමණික ශ්‍රමිකයින් ඇතුළු සියලුම පුරවැසියන්ට ප්‍රවේශ විය හැකි විශ්වීය (Universal), දායක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් නිර්මාණය කිරීම අන්තර්ගත වේ. රාජ්‍ය සේවකයින්ට දැනට ලබාදෙන විශ්‍රාම වැටුප මූල්‍යමය වශයෙන් තිරසර නොවේ.

- සියලු පාර්ශ්වකරුවන් සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව පුද්ගලික අංශයේ සේවා නියුක්තිකයන් සඳහා මාසිකව රු. 17,500ක සීමාවේ සිට අවම වැටුප මාසිකව රු. 25,000 දක්වා හෝ සංශෝධනය කළ යුතු බවට යෝජනා කරන්නෙමු.

- "ජන සවිය", "සමෘද්ධි", "අස්වැසුම", "ගැමිදිරිය" යන සමාජ ආරක්ෂණ වැඩසටහන්වල යහභාවිතයන් උකහා ගනිමින්, පුළුල් නව වැඩපිළිවෙලක් සකස් කරමින් දිළිඳුකම ඉතිහාසයේ කොටසක් බවට පත් කරනු ඇත. නව වැඩසටහන මඟින් මාසිකව ප්‍රතිලාභී පවුල් සඳහා මාස 24ක් දක්වා රු.20,000 ක දීමනාවක් ලබා දෙනු ඇත. නව වැඩසටහන දියත් කරන තුරු, අස්වැසුම ප්‍රතිලාභ මුදල වැඩි කරමින් පහත පරිදි ලබා දෙනු ලැබේ
  - අවදානමට ලක්වූ සහ සංක්‍රාන්තික පවුල් සඳහා මසකට රු. 10,000 (රු. 5,000 සිට) දක්වා
  - දුප්පත් පවුල් සඳහා මසකට රු. 10,000 (රු. 8,500 සිට) දක්වා
  - අන්ත දිළිඳු පවුල් සඳහා මසකට රු. 15,000ක් බැගින්

මෙම නව වැඩසටහන සෘජු මුදල් ලබාදීමකට සීමා නොවන අතර ප්‍රතිලාභී පවුල්වල පරිභෝජනය, ඉතිරිකිරීම්, ආයෝජනය, නිෂ්පාදනය සහ අපනයන යන සියලු අංශයන් කෙරෙහි අවධානය යොමු කරන දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කරන වැඩසටහනකි.

- ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය තුරන් කිරීමේදී සමෘද්ධි වැඩසටහන විසින් ඉටු කර ඇති සුවිශේෂී කාර්යභාරය හඳුනාගනිමින්, නව වැඩසටහන ක්‍රියාත්මක කරන තුරු, වර්තමාන වැඩසටහනේ ප්‍රතිලාභීන් වැරදි ලෙස හඳුනාගැනීම, විසඳීම සඳහා විද්‍යාත්මක සමීක්ෂණයක් සිදු කරනු ඇත. මෙය දැනට ක්‍රියාත්මක වැඩසටහනෙන් අසාධාරණ ලෙස අත්හැරුනු සමෘද්ධිලාභීන් සහ ආර්ථික අර්බුදය හේතුවෙන් දුගී බවට පත් වූවන්ට සහනාධාර ලබාදීම සහතික කරනු ඇත. සමෘද්ධි බැංකුවල ප්‍රාග්ධනය ශක්තිමත් කෙරෙනු ඇත. එහිදී කළමනාකරණය වැඩිදියුණු කිරීම, සේවකයින් සඳහා තිරසාර වෘත්තීය මාර්ග නිර්මාණය කිරීම, අනිවාර්ය ඉතිරි කිරීමේ වැඩසටහන හා නිවාස ලොතරැයි වැනි ඵලදායී ව්‍යාපෘති අඛණ්ඩව පවත්වාගෙන යනු ඇත. එමෙන්ම සමෘද්ධි සේවකයින්ගේ දීර්ඝ කාලීන කළමනාකරණ සහ විශ්‍රාම වැටුප් ගැටලු ද විසඳනු ඇත.

- අපගේ ආර්ථිකය තුළ සැමවිටම සක්‍රීය ප්‍රජාවන් වෙත ඉලක්කගත සහාය ලැබීම සහතික කරමින් QR කේත ක්‍රමය පාදක කර ගත් වැඩපිළිවෙලක් හරහා විශේෂ ඉන්ධන සහනාධාරයක් ලබා දෙන්නෙමු. මෙම සහාය ගොවීන්, "ශක්ති" වී මෝල් හිමියන්, ත්‍රීරෝද රථ රියදුරන්, ධීවරයන්, සහ පාසල් ප්‍රවාහන අංශයේ රියදුරන්ට ලබා දෙනු ඇත.



NATIONAL
VISIONARY
SUMMIT
STRATEGIC GROWTH VISION
FOR REBUILDING THE NATION
NATIONAL
VISIONARY
SUMMIT
STRATEGIC GROWTH VISION
FOR REBUILDING THE NATION

# රාජ්‍ය ආරක්ෂාව

"සංහිඳියාවෙන්, සහජීවනයෙන් හා සුරක්ෂිත බවින් යුත් ආරක්ෂිත ශ්‍රී ලංකාවක් සඳහා ජාතික ආරක්ෂාව සහ පාරිසරික තිරසරභාවය සහතික කරන අතරම, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම, ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීම සහ සියලු පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට කැපවී කටයුතු කරමු."



## ප්‍රජාතන්ත්‍රවාදය හා සංහිඳියාව ශක්තිමත් කිරීම

- කිසිඳු ආකාරයකින් ජාතිවාදය, අන්තවාදය හෝ බෙදුම්වාදය ප්‍රවර්ධනය නොකෙරේ. ජාතිය, ආගම, කුලය, පන්තිය හෝ ස්ත්‍රී පුරුෂ භාවය නොසළකා සෑම පුරවැසියෙකුම නීතිය ඉදිරියේ සමානව සැළකේ.

- ශ්‍රී ලංකාවේ වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අවශ්‍ය පරිදි ත්‍රෛභාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්නෙමු.

- නියෝජිතයන් තෝරාගනු ලබන සියලුම ආයතනවල කාන්තා හා තරුණ නියෝජනය සහතික කිරීම සඳහා නීති පනවන්නෙමු.

- ආගමික නායකයන්, පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශපාලන පක්ෂ සහ සිවිල් සමාජ සාමාජිකයන් යන පාර්ශ්වයන් වෙතින් නිසි පරිදි අදහස් විමසීම් සිදුකොට වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කොට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමට සමගි ජන බලවේගය සමගි ජන සන්ධානය කැපවී සිටී. එම ක්‍රියාවලිය තුළ දී, අපගේ ප්‍රතිපත්තිය වනුයේ අපගේ පවත්නා දේශපාලන ක්‍රමය එක් රටක් තුල 13වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මත පදනම් වූ උපරිම බලය බෙදීමක් ද සහිතව පාර්ලිමේන්තු ක්‍රමයක් කරා පරිවර්තනය කිරීමයි.

- තීරණ ගැනීමේ ක්‍රියාවලියට පුරවැසියන් ක්‍රියාකාරීව සම්බන්ධ කර ගැනීම සඳහා "ග්‍රාම රාජ්‍ය" සහ "නගර රාජ්‍ය" නම් ප්‍රජාපාදක ප්‍රජාතාන්ත්‍රික ආයතන නිර්මාණය කෙරෙනු ඇත.

- නව ව්‍යවස්ථාව සම්මත වන තෙක් ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය ඇතුළු වත්මන් ව්‍යවස්ථාව සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමට රජය කැපවී සිටී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පළාත් සභාවලට ලබාදී ඇති බලතල ජනාධිපතිවරයා විසින් ඒකපාර්ශ්වීයව ආපසු ලබා ගැනීමට කටයුතු නොකරනු ඇත. පළාත් මට්ටමින් සිදු කෙරෙන සංවර්ධන කාර්යයන් ශක්තිමත් කරමින් පළාත් සභා ක්‍රියාත්මක වීම සඳහා වන කැපවීම නැවත සපථ කරන්නෙමු.

- ජාතික රජයක් (National Government) පිහිටුවීමට ක්‍රියා කළහොත් අමාත්‍ය/ නියෝජ්‍ය අමාත්‍ය/ රාජ්‍ය අමාත්‍ය ධුර සංඛ්‍යාව ඉහළ නැංවීමට පාර්ලිමේන්තුව වෙත හැකියාව ලබාදෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විධිවිධානය අවලංගු කරෙනු ඇත.

  ජාතික රජයක් පිහිටවුවද, අමාත්‍යවරුන් සංඛ්‍යාව සම්බන්ධයෙන් පවත්නා සීමාව අදාළ වනු ඇත.

- මාස 06ක් ඇතුළත පළාත් සභා මැතිවරණ පැවැත්වෙන අතර උපරිම මූල්‍ය කාර්යක්ෂමතාවකින් හා සඵලදායීතාවකින් යුතුව පළාත් සභා ක්‍රියාත්මක වන බව සහතික කිරීමට කඩිනමින් පියවර ගනු ලැබේ.

- ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය පිළිබඳ කාර්යාලය, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සහ හානිපූරණ කාර්යාලය ශක්තිමත් කර ඒවායේ අරමුණු ඵලදායී ලෙස හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත. අවතැන් වූවන් නැවත පදිංචි කිරීම සඳහා පහසුකම් සපයන්නෙමු. ආරක්ෂක අවශ්‍යතා සඳහා අවශ්‍ය නොවන සියලුම ඉඩම් තවදුරටත් ප්‍රමාද නොවී ඒවායේ හිමිකරුවන්ට ආපසු ලබා දෙනු ඇත. රාජ්‍ය අනුග්‍රහය සහිතව ජන විකාශන වෙනස්කම් නොකරන ප්‍රතිපත්තිය නොකඩවා පවත්වාගෙන යනු ඇත. තවද, ගැටුම්වලින් පීඩාවට පත් ප්‍රදේශවල ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා ආයෝජනය කිරීමට විශේෂිත සහන හා දිරිගැන්වීම් සපයනු ඇත.

- යටිතල පහසුකම් ප්‍රතිස්ථාපනය, ප්‍රජා සංවර්ධන කටයුතු සහ තිරසර ආර්ථික අභිවෘද්ධිය ද කෙරෙහි අවධානය යොමු කරමින් යුද්ධයෙන් බලපෑමට ලක්වූ ප්‍රදේශයන් නැවත ගොඩනැගීම හා සංවර්ධනය වෙනුවෙන් වූ කැපවීම තහවුරු කිරීම සඳහා ජාත්‍යන්තර ආධාර සමුළුවක් සංවිධානය කරන්නෙමු.

- නීති විරෝධී ලෙස කල් දමන ලද පළාත් පාලන මැතිවරණ කඩිනමින් පැවැත්වීමට අවශ්‍ය නීතිමය හා පරිපාලනමය පියවර ගන්නෙමු.

- අධිකරණ පරිපාලනයට විධායකය මැදිහත්වීම වැළැක්වීම සඳහා නීති ප්‍රතිසංස්කරණ සිදු කිරීම සහ අධිකරණයේ ස්වාධීනත්වය හා කාර්යක්ෂමතාව ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණයන් සිදු කරන්නෙමු.

- මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයේ විෂය පථය පුළුල් කර සමාජික හා ආර්ථික අයිතිවාසිකම්, සංස්කෘතික අයිතිවාසිකම්, කාන්තාවන්ගේ, ළමුන්ගේ, වයස්ගත පුද්ගලයන්ගේ හා ආබාධිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම්, පාරිසරික, නිවාස හා සංවර්ධන අයිතිවාසිකම් ඇතුළත් කෙරෙනු ඇත. පුරවැසියන්ට යුක්තිය පහසුවෙන් ලබා ගැනීමට හැකි වන පරිදි, අභියාචනාධිකරණ නඩු විභාග සෑම පළාතකම සිදු කෙරෙනු ඇත. එයට මූලික අයිතිවාසිකම් හා භාෂා අයිතිවාසිකම් පිළිබඳ මූලික අධිකරණ බලයක් පැවරෙනු ඇත. අභියාචනාධිකරණයේ අවසරය හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ විශේෂ අවසරය සහිතව ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිවනු ඇත.

  කවරාකාරයේ හෝ දූෂණ ක්‍රියාවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීමක් සේ සැලකෙනු ඇති අතර දූෂණ විරෝධය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කෙරෙන බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළ වගබලා ගැනෙනු ඇත.

- රාජ්‍ය සේවය පූර්ණ නිර්දේශපාලනීකරණයකට ලක් කිරීම සහ ඒ සම්බන්ධ ප්‍රමිතීන් හා විධිවිධාන රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ලබා දීම.

- පාර්ලිමේන්තු වගකීම් ඉටු කිරීමේදී අවශ්‍ය ප්‍රමිතීන් හා මූලධර්ම ස්ථාපිත කිරීම සහ පාර්ලිමේන්තුව කෙරෙහි මහජන විශ්වාසය ඇති කිරීම සඳහා 2018.04.15 දින නීතියක් බවට පත් වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ චර්යා ධර්ම සංග්‍රහය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ඇත. ඊට සමගාමීව, පළාත් සභා මන්ත්‍රීවරුන් සහ පළාත් පාලන ආයතන මන්ත්‍රීවරුන් විසින් අනුගමනය කළ යුතු චර්යා ධර්ම සංග්‍රහ සඳහා නීති සම්පාදනය කිරීමට ද ප්‍රමුඛත්වය දෙනු ඇත.

- පත්කිරීම් සිදු කිරීමේදී අමාත්‍යවරුන්ට තම අමාත්‍යාංශවල විෂය පථයට අයත් රජයේ හා අර්ධ රාජ්‍ය ආයතනවලට තම පවුලේ සාමාජිකයින් බඳවා ගැනීමට අවසර නොදෙනු ඇත.

- දැනට අධිකරණයේ දූෂණ චෝදනා සම්බන්ධයෙන් අධි චෝදනා ලැබ ඇති පුද්ගලයින්ට අනාගත මැතිවරණවලදී නාම යෝජනා හෝ කිසිදු රජයේ තනතුරක් ලබා නොදෙනු ඇත.

- වරප්‍රසාද හා අනුග්‍රහයන් හේතුකොට මන්ත්‍රීවරුන් පක්ෂ මාරු කිරීම වැළැක්වීමට නීති සංශෝධන හඳුන්වා දීම සහ ඒ හා සම්බන්ධ අධිකරණ ක්‍රියාමාර්ග මාස 2ක් ඇතුළත අවසන් කිරීම අනිවාර්ය කරන විධිවිධාන ඉදිරිපත් කරනු ඇත .

## විදේශ සබඳතා සහ වෙළෙඳ සන්ධාන

- අප රාජ්‍යය බහු පාර්ශවීය විදේශ ප්‍රතිපත්තියක් සහිත ස්වෛරී රාජ්‍යයකි. අපගේ දැක්ම වන්නේ සියල්ලන් සමඟ මිතුරු වීම සහ කිසිවෙකු සමඟ සතුරු නොවීමයි.

- ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය නීතියේ ආධිපත්‍යය සහ ජාත්‍යන්තර සම්මුතීන් මගින් බලගැන්වෙන හා ප්‍රවර්ධනය කරන්නාවූ බහු පාර්ශ්වීය ප්‍රතිපත්තියකි. මෙහි එන ප්‍රධාන මූලධර්ම තුළට බලය භාවිතා නොකිරීම, ගැටුම් සාමකාමීව නිරාකරණය කරගැනීම සහ මානව හිමිකම්වලට අනුගතව කටයුතු කිරීම ද ඇතුළත් වේ.

- හමුදාමය සන්ධානවලින් තොරව ආසන්න සහ කලාපීය අසල්වැසියන් සමඟ සාමකාමී සහජීවනය, කලාපීය ඒකාබද්ධතාව ප්‍රවර්ධනය කිරීමේ නායකත්වය ගැනීම මූලික ප්‍රතිපත්ති වනු ඇත.

- ශ්‍රී ලංකාව සියලු රටවල් සමඟ සම්බන්ධතා පවත්වන අතර ආර්ථික රාජ්‍ය තාන්ත්‍රිකභාවය එහි පදනම වනු ඇත. අපගේ ආර්ථික රාජ්‍ය තාන්ත්‍රික උපාය මාර්ගික ආයෝජන, වෙළඳාම සහ සංචාරක කර්මාන්තය යන කුලුනු මත ගොඩනැගෙනු ඇත. ගෝලීය වෙළෙඳපළ තුළ ශ්‍රී ලංකාව ස්ථානගතව ඇති ස්ථානය ඉහළට ඔසවා තබනු පිණිස එක්සත් ජනපද වෙළඳ නියෝජිතයනට සමාන වෙළෙඳ ගනුදෙනු සඳහා වූ සුවිශේෂී රාජ්‍ය ඒකකයක් ස්ථාපනය පිළිබඳ අවධානය යොමු කෙරෙන වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්තියක් ගොඩනගන්නෙමු.

- ඉන්දියන් සාගර කලාපයේ ජනතාවගේ උපරිම යහපත සහතික කරමින්, ඉන්දියන් සාගරයේ නීති ක්‍රියාත්මක වීම ප්‍රවර්ධනය කරනු ඇත.

- ශ්‍රී ලංකාව කලාපීය වෙළෙඳ සන්ධාන සඳහා කැපවී සිටිනු ඇත.

- 75%ක වෘත්තීය රාජ්‍ය තාන්ත්‍රිකයින් සහ උපරිම වශයෙන් 25%ක අනෙකුත් පත්කිරීම්වල ආදර්ශ මිශ්‍රණයක් සහතික කරන්නෙමු. බඳවා ගැනීමේ ක්‍රියාවලිය ප්‍රතිසංස්කරණය කරනු ලබන අතර දේශපාලනඥයින්ගේ පවුලේ සාමාජිකයින් විදේශ සේවයේ තනතුරු සඳහා පත් කිරීම තහනම් කෙරෙනු ඇත.

## ජාතික ආරක්ෂාව

- දූරදර්ශී හා ශක්තිමත් විදේශ ප්‍රතිපත්ති මත පදනම්වූ ආරක්ෂක සහයෝගීතාවන් තුළින් ජාතික ආරක්ෂාව ශක්තිමත් කිරීම.

- නව නීතියක් මගින් ජාතික ආරක්ෂක කවුන්සිලය ස්ථාපිත කොට, එයට අවශ්‍ය බලතල පවරා දීම.

- රටේ ආරක්ෂාව, නීතිය හා සාමය සහ බුද්ධි අංශ අන්තර් සම්බන්ධීකරණයක් සහිතව කටයුතු කරන වෙන් වෙන් හා ස්වාධීන ඒකක ලෙස සළකනු ඇත. මෙම ව්‍යුහය තුළ ඒකාබද්ධ බුද්ධි රාමුවක් ස්ථාපිත කිරීමෙන් රාජ්‍ය බුද්ධි අංශයට ව්‍යුහාත්මක පිළිගැනීමක් ලබා දෙනු ඇත. මෙම සම්බන්ධීකරණ ප්‍රවේශය මගින් තොරතුරු හුවමාරුව වැඩිදියුණු කරනු ඇති අතර, මෙහෙයුම් කාර්යක්ෂම කරමින්, එක් එක් අංශයේ ස්වාධීනත්වය පවත්වා ගනිමින් සමස්ත ජාතික ආරක්ෂක හැකියාවන් වැඩිදියුණු කරනු ඇත. මෙම රාමුව මගින් ස්වාධීන ආයතන අතර කාර්යක්ෂම සහයෝගීතාව සහතික කරන අතර ශක්තිමත් හා ප්‍රතිචාරාත්මක ජාතික ආරක්ෂක යාන්ත්‍රණයක් නිර්මාණය කරනු ඇත.

- යුද හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව යන සන්නද්ධ හමුදාවන් සහ සිවිල් ආරක්ෂක බලකාය සඳහා අත්‍යවශ්‍ය තාක්ෂණික පහසුකම්, නවීන ආයුධ, උපකරණ සහ දේශීය හා විදේශීය පුහුණුව ප්‍රමාණවත් ලෙස ලබාදීම. ත්‍රිවිධ හමුදාවේ සහ සිවිල් ආරක්ෂක කාර්ය මණ්ඩලයේ රැකියා සුරක්ෂිත කෙරෙනු ඇත. ඔවුන්ට ඉහළ වැටුප්, දීමනා සහ සුභසාධන ප්‍රතිලාභ ලබා දීමට සහතික වෙනු ඇත.

- ආයතනික ප්‍රතිසංස්කරණ හරහා සන්නද්ධ හමුදාවන් විසි එක් වෙනි සියවසට ගැළපෙන පරිදි නවීකරණය කිරීම.

- එසේම සියලුම ජාතීන් හා ආගමික කණ්ඩායම් වෙත නිසඟයෙන්ම ලැබිය යුතු ගෞරවය ලබා දෙන ආකාරයෙන් කටයුතු කිරීම හා සියලුම ජන කණ්ඩායම් අතර අන්‍යෝන්‍ය සහයෝගිතාව පදනම් කොට ගැනීම තිරසර ආරක්ෂාවක පදනම වනු ඇත.

## නීතිය හා සාමය

- පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරයේ වින්දිතයන්ට යුක්තිය ඉටු කිරීම සඳහා 1948 අංක 17 දරන පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව විධිමත් ලෙස බලය පවරන ලද පරීක්ෂණ කොමිෂන් සභාවක් මාස 3ක් තුළ පිහිටුවනු ඇත. එම කොමිෂන් සභාවේ නිර්දේශ මත පදනම්ව පාස්කු ඉරුදින ප්‍රහාරය සඳහා වගකිව යුතු අපරාධකරුවන්ට එරෙහිව ත්‍රිපුද්ගල ස්ථිර මහාධිකරණයක් (Trial at bar) මගින් දිනපතා නඩු විභාග කර දඬුවම් ලබා දීම රජයේ ප්‍රමුඛ වගකීමක් ලෙස සළකනු ලැබේ.

- පසුගිය රජයේ පශ්චාත් ආදාහන ප්‍රතිපත්තිය විමර්ශනය කරනු ලැබ නිසි නීතිමය ක්‍රියාමාර්ග හරහා එයට වගකිව යුත්තන් වගකීමට බැඳ තබනු ඇත.

- දැනට හඳුන්වා දී තිබෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (තාවකාලික විධිවිධාන) අහෝසි කර රටේ ආරක්ෂාව සහ මානව හිමිකම් සුරකින වඩාත් යහපත් වූ ත්‍රස්තවාදය වැළැක්වීමේ නව නීතියක් ස්ථාපිත කරනු ඇත.

- සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ (ICCPR) නීතිය බලධාරීන් විසින් අවභාවිතා කිරීම වැලැක්වීම පිණිස අවශ්‍ය නීතිමය සංශෝධන සිදු කරනු ඇත. වෛරී ප්‍රකාශ පැතිරීම වැළැක්වීමට අවශ්‍ය නීති යාන්ත්‍රණය ශක්තිමත් කිරීමට රජය කැපවී සිටී.

- යුක්තියේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ නීති ප්‍රමාදයන් අවම කිරීම සඳහා වසර 5ක් ඇතුළත අධිකරණ පද්ධතිය සම්පූර්ණයෙන්ම ඩිජිටල්කරණය කෙරෙනු ඇත.

- ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව තවදුරටත් ශක්තිමත් කරනු ලබන අතර පුරවැසියන් වෙත සෑම වර්ගයකම නඩු සඳහා නීති ආධාර ලබා දීම තහවුරු කෙරේ.

- සෑම සමථමූල මණ්ඩලයක් සඳහාම වෙන් වූ ස්ථිර කාර්යාලයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ ස්ථාපනය කරනු ලබන අතර ඊට අවශ්‍ය ප්‍රමාණවත් පහසුකම් ලබා දී ස්ථිර කාර්ය මණ්ඩලයක් පත් කරනු ඇත.

- දේශපාලනික හේතු මත ඉල්ලා අස්කරගෙන ඇති අපරාධ නඩු නව රජය බලයට පත්වී මාස 03ක් ඇතුළත නැවත පැවරීමට කටයුතු කරනු ඇත.

- ආර්ථික අර්බුදයෙන් අසාධාරණයට ලක්වූ පුද්ගලයන්ට ඉදිරියටත් එම අර්බුදයට වගකිව යුතු පුද්ගලයන්ගෙන් වන්දි ලබා ගැනීමට හැකිවන පරිදි අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට සහාය ලබා දෙනු ඇත.

- වසර 150 කට වඩා පැරණි පොලිස් ආඥාපනත යාවත්කාලීන කොට පොලිස් නිලධරයින්ගේ බඳවා ගැනීම්, උසස්වීම් සහ ස්ථාන මාරුවීම් කඩිනමින් සහ සාධාරණව ඉටු කරවා ගැනීමට අවශ්‍ය විධිවිධාන සලසන අතර පොලිස් නිලධරයින්ට අවශ්‍ය ප්‍රමාණවත් පහසුකම් ලබාදී පොලිස් සේවය ජාත්‍යන්තර මට්ටමට නවීකරණය කිරීමට කටයුතු කරනු ඇත.

- දිවයින පුරා 119 හදිසි ඇමතුම් සඳහා විනාඩි 30ක් ඇතුළත ප්‍රතිචාර දක්වනු ලබන බවට වගබලා ගනු පිණිස පොලිස් දෙපාර්තමේන්තුවට අවශ්‍ය සම්පත් ලබාදී පොලිස් දෙපාර්තමේන්තුවේ කටයුතු ඩිජිටල්කරණය කරනු ඇත.

## දූෂණ විරෝධී නීති

- මෑතකදී සම්මත කරන ලද 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සහ පුහුණුව ලබා දෙනු ඇත.

- නඩු පැවරීමේ ස්වාධීනත්වය සහ කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා ස්වාධීන මහජන අභිචෝදක කාර්යාලයක් ස්ථාපිත කෙරෙනු ඇත.

- දැනටමත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති සොරකම් කරන ලද වත්කම් ප්‍රතිසාධන පනත් කෙටුම්පත (Stolen Assets Recovery Bill) නව රජයක් තේරී පත්වී මාසයක් ඇතුළත සම්මත කෙරෙනු ඇත. දූෂණ ක්‍රියා මගින් පැහැර ගත් වත්කම් ප්‍රතිසාධනය කිරීම කඩිනමින් සිදු කෙරෙනු ඇත.

- දැනට පිහිටුවා ඇති දූෂණ විරෝධී ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය යළි බලගන්වා අල්ලස් සහ දූෂණ සම්බන්ධ නඩු අප්‍රමාදව දිනපතා විභාග කිරීමට (Day-to-day trials) අවශ්‍ය වාතාවරණය සකස් කරනු ඇත.

## මත් උවදුර මැඬලීම

- ශ්‍රී ලංකාවට මත්ද්‍රව්‍ය ගෙන ඒම වැළැක්වීම හා ශ්‍රී ලංකාව හරහා වැටී ඇති ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය ප්‍රවාහන මාර්ග බිඳ දැමීම සඳහා අන්තර්ජාතික පොලීසිය සහ අනෙකුත් විදේශීය බුද්ධි සේවාවන් සමග වඩාත් සමීපව කටයුතු කරනු ඇත.

- මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට එරෙහි නඩු මාස 06ක් තුළ විභාග කර දඬුවම් කිරීම සඳහා මත්ද්‍රව්‍ය විරෝධී විශේෂ මහාධිකරණයක් (Anti-narcotic special high court) පිහිටුවනු ලැබේ.

- මත්ද්‍රව්‍යයන්ට ඇබ්බැහි වූ තැනැත්තන් පුනරුත්ථාපනය කොට සමාජයට එක් කිරීම සඳහා නවීන පහසුකම්වලින් යුතු පුනරුත්ථාපන මධ්‍යස්ථාන 25 ක් රට පුරා පිහිටුවනු ලැබේ.

- වසර 02 ක් තුළ විෂ මත්ද්‍රව්‍ය ජාවාරම සහමුලින්ම අවසන් කිරීමට කටයුතු කරන්නෙමු.

- මත්පැන් භාවිතය සහ දුම් පානය අධෛර්යමත් කිරීමට කටයුතු කරන අතර අක්‍රමවත් ලෙස මෑත කාලය තුළ ලබාදී ඇති "මත්පැන් බලපත්" අවලංගු කිරීමට කටයුතු කරන්නෙමු.

## තිරසර පරිසරය

- සියලු අංශයන්හි එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීමේ අභිලාශ කෙරෙහි අපගේ කැපවීම සපථ කරන අතර සංවර්ධන ක්‍රියාවලිය තුළ පරිසරය ආරක්ෂා කිරීමට වගබලාගනු ඇත. 1980 ජාතික පාරිසරික පනත (සංශෝධන සහිත) සහ සෙසු නීති සහ රෙගුලාසිද යාවත්කාලීන කරනු ඇත.

- සූර්ය විදුලි බලය, සුළං විදුලි බලය, පොම්ප ගබඩා, රළ විදුලිය, හරිත හයිඩ්‍රජන්, ජෛව ස්කන්ධ (Bio-mass) ඇතුළු පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර ප්‍රවර්ධනය කිරීම මගින් ද සම්ප්‍රේෂණ පද්ධතිය තුළ පරිසර හිතකාමී විකල්ප බලශක්ති මූලාශ්‍ර හඳුන්වාදීම මගින් ද ගෝලීය උණුසුම පාලනය කිරීම පිළිබඳ පැරිස් සම්මුතියේ ඇති එකඟතාවන් අනුව කටයුතු කිරීමට අවශ්‍ය ප්‍රමුඛතාව ලබා දෙනු ඇත.

- නිරතුරු මහජනතාව සමග ගැටෙන්නාවූ අලින්, වඳුරන්, මොණරුන් සහ සෙසු සතුන්ද කෙරෙහි අවධානය යොමු කරමින් සතුන් සහ මිනිසුන් අතර ඇතිවන්නාවූ ගැටුම් සමනය සඳහා විද්‍යාත්මක පදනමකින් යුත්, පාරිසරිකව තිරසර වූ විසඳුම් ක්‍රියාත්මක කිරීමට අප රජය කැපවේ.

---

**සජිත් ප්‍රේමදාස වන මාගේ නායකත්වයෙන් සමගි ජන සන්ධාන රජයේ ප්‍රතිපත්ති සහ ඒ යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ඉදිරි වැඩසටහන් පිළිබඳව සංක්ෂිප්ත සාරාංශයක් ඔබගේ දැනගැනීම පිණිස මෙලෙස මුද්‍රණය කරන ලදී.**

**මෙම මූලික සංකල්ප රාමුවට එකඟ වෙමින් එක් එක් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් කටයුතු කරන විශේෂඥයින්, වෘත්තිකයින් සහ ක්‍රියාකාරීන් සමඟ පුළුල් සංවාදයකින් පසුව ඇති කර ගත් එකඟතාවන්, ප්‍රතිපත්තීන් හා ප්‍රඥප්තීන් ලෙස මෙම ප්‍රතිපත්ති ප්‍රකාශයට සමගාමීව එළිදක්වනු ඇත.**

# සැමට ජයක්

සජිත් ප්‍රේමදාස
சஜித் பிரேமதாச
Sajith Premadasa

X

ඔබගේ ඩිජිටල් පිටපත මෙතැනින් බාගත කරන්න